# 2022.03.21 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව
# මීගහකිවුල ප්‍රාදේශිය සභාව

**පැමිණීම.**

01.ගරු සභාපති - එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා
02.ගරු උප සභාපති - ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. බාලසුන්දරම් මැතිතුමා
11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා
15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා
16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා
18.සභා ලේකම් - ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය
19.විෂය නිලධාරි - ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය

**සභාව ආරම්භ කිරිම.**

පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා මූලාසනය ගනිමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලාත්,සභා ලේකම්තුමිය හා විෂය නිලධාරී පිළිගනිමින් සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී. මූලාසනය විසින් එදින න්‍යාය පත්‍රාණුකූලව මුලින්ම පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමට සභාවට ඉදිරිපත් කරන ලදී.

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මෙහිදී මූලාසනය සභාව අමතමින් ගරු මන්ත්‍රීවරුනි, පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සළකා සභා යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර සභා වාර්තාවල සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමනි,පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තා බැවින් සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.**

මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම මේ ගරු සභාවට දන්වා සිටිනවා.

**මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තවේ සංශෝධන කිසිවක් නොමැති බැවින් පසුගිය මහ සභා වාර්තාව සම්මත කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වු බව සභාවට දන්වන ලදී.**

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**<u>(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා විශේෂ නිවේදන කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**<u>(ඇ) සංදේශ, පෙත්සම් පැමිණිලි සහ ආයාචනා සභා ගත කිරීම.</u>**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රානුකූලව කල් දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**<u>(ඈ) කල්දෙනු ලැබූ ප්‍රශ්න</u>**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා කල්දෙනු ලැබූ ප්‍රශ්න කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**<u>(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

ගරු සභාපතිතුමා විසින් පළමු යෝජනා සභාව හමුවේ තබන ලදී.

1) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පුංචි ලෝකාන්තයේ අනාරක්ෂිත ස්ථානය ආවරණය වන පරිදි ආරක්ෂිත වැට ඉදිකිරීමේ කටයුතු යුධ හමුදා නිලධාරින්ගේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කෙරෙන අතර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ යුධ හමුදා නිලධාරින් සඳහා සංග්‍රහ කටයුතු සඳහා යන වියදම් සහා අරමුදලින් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**පුංචි ලෝකාන්තයේ අනාරක්ෂිත ස්ථානය ආවරණය වන පරිදි ආරක්ෂිත වැට ඉදිකිරීමේ කටයුතු යුධ හමුදා නිලධාරින්ගේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කෙරෙන අතර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය** සහ යුධ හමුදා නිලධාරින් සඳහා සංග්‍රහ කටයුතු සඳහා යන **වියදම් සභා අරමුදලින් දැරීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 02 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

2) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ජල යෝජනා ක්‍රමය දැන් ඇවිල්ලා තියෙනවා. මේකේ කන්ට්‍රාක් එක අරගෙන තියෙන්නේ සන්කෙන්ලංකා කන්ට්‍රක් සමාගම. කැටවත්තට තිබුණේ නැහැ මම කැටවත්ත දාලා දුන්නා. එවගේම දැන් අපි රැස්වීමක් පටන් ගන්නවා. දැන් මම අපි මේක පටන් ගන්නවා අරාවේ ඉඳලා මීගහකිවුල කරඳගහමඩ මේක යනවා කුඩා දූංහිඳ ළඟට වෙනකම් යනවා. තල්දෙන ලයින් එක ඔක්කෝම cover වෙනවා. කළුගහකඳුර ළඟට යනවා උඩට යන්නේ නැහැ. ඊට පස්සේ අපි කැටවත්තට දෙනවා. ඊට

පස්සේ මේ සියළු පවුල් ටික ඔක්කෝම ආවරණය වෙන්න සියළු මාර්ගවල යනවා. එතකොට මේ මාර්ග වල නොයෙන මාර්ග තියෙනවා. මොකද මේ හැම එකක්ම ඇස ගැටිලා නැහැ. ඒක නිසා මම මන්ත්‍රීවරුන්ට යෝජනා කරනවා ලබන සෙනසුරාදට ඔක්කෝම එනවා නම් මට පුළුවන් කන්ට්‍රක් සමාගමයි ජල සම්පාදන මණ්ඩලය කැඳවලා මෙතන හරි හෝටලයක හරි රැස්වීමක් තියන්න. ඔයගොල්ලන්ගේ එක් කෙනෙක්වත් එන්න බැරිවුනායි කියලා කියන්න බැහැ. මොකද සභාවට එනවා වගේ එන්න ඕනි. අපි හිතමුකෝ මන්ත්‍රීතුමාලාගේ ගෙදරට යන පාර මාක් වෙලා නැහැ. නාමල් මන්ත්‍රීතුමා ජනතා විමුක්ති පෙරමුණේ කියලා මාක් වෙලා නැහැ කියලා කියන්න පුළුවන්. එහෙම දෙයක් වෙලා නැහැ. එහෙම දෙයක් වෙලා තියෙන්නත් පුළුවන්නේ. එහෙම වෙලා තිබුනොත් ඒක නිවැරදි කර ගන්න අවස්ථාව තියෙනවා. මේ අවස්ථාවේදී ඔයගොල්ලන්ගේ වසම ඔයගොල්ලන්ට යන්න ඕනි ටික හැබැයි යන්න බැරි පාරවල් තියෙනවා. සමහර තැන් වලට යන්න බැහැනේ. ඒවාට ඒගොල්ලන්ගේ තාක්ෂණික හේතු නිසා යන්න බැරි තැන් වලට යන්න කියලා කවුරුවත් කරදර කරන්න එපා. අපිට ඇස නොගැටුණු ස්ථාන මාර්ග ටික හරිගස්සගන්න ඔයගොල්ලන්ට අවස්ථාවක් හම්බ වෙලා තියෙනවා. එතකොට සෙනසුරාදා ප.ව. 2.00ට මෙතනදී. ඒගොල්ලන්ගේ plan එක ඔක්කෝම ගේනවා. Plan එක විස්තර කරනවා. ලයිට් නැති වුනොත් අපිට ලේකම්තුමිය සෙනසුරාදාට ජෙනරේටරයක් හොයලා තියන්න වෙනවා.

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 03 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

3) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් සකස් කරන ලද මීගහකිවුල ජල පොම්පාගාරය අසල ඉදිකර ඇති නළ ලිඳ සහ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ඉදිකර ඇති නළ ලිං සඳහා ජල මෝටර් හා ජල මීටර් 100ක් කැඳවන ලද මිල ගණන් වලට අනුව අවම මිල ගණන් යටතේ මිලදී ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**පසුගිය සභා වාරයකදී සම්මත වුණු මීටර් 50ක් සහ මොටර් සඳහා සභා අනුමැති ලබා දුන් අතර එම නිසා පසුගිය සභාවේදී සම්මත වුණු මීටර් 50 සහ මෙම යෝජනාව යටතේ මීටර් 50ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 04 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

4) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2022 වැඩ ලක්ෂයේ පහත සඳහන් යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**පළමු කාර්තුව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලබන යෝජනා**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | වෙන් කළ මුදල(රු.) |
|---|---|---|
| 1 | කැටවත්ත අරාව ගෙදර පාර කොන්ක්‍රීට් කිරීම. | 1,000,000.00 |
| 2 | වෙන්දේසියාය පානීය ජල ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම. | 500,000.00 |
| 3 | බැකෝ යන්ත්‍ර යොදා ඇල්ලන්ද මාර්ගය සංවර්ධනය කිරීම. | 250,000.00 |
| 4 | නිලි වත්ත ජල යෝජනා ව්‍යාපෘතින් අළුත්වැඩියා කිරීම. | 1,200,000.00 |
| 5 | තඹලකැටිය මාර්ගය සංවර්ධනය කිරීම. (සොහොන් මාර්ගය) | 900,000.00 |

| | | |
|---|---|---|
| | | |
| 6 | දිඹුලේ ගහ යට ඉහල මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 7 | වලපන කෘෂි මාර්ගය සංවර්ධනය කිරීම. | 1,200,000.00 |
| 8 | දුම්වැටි කඳුර අංක 03 මාර්ගයේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම. | 600,000.00 |
| 9 | 19 කණුව බිංගොඩ මාර්ගය මුල් කොටස සංවර්ධනය කිරීම. | 600,000.00 |
| 10 | මීගහකිවුල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 1,200,000.00 |
| 11 | ගල්පොත්තවල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 800,000.00 |
| 12 | ග්‍රාම නිලධාරි කාර්යාලය පවල්වාගෙන යන ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම. | 300,000.00 |
| 13 | වෙන්දේසියාය සුසාන භූමියට පිවිසෙන මාර්ගය පස් කපා පුළුල් කර සංවර්ධනය කිරීම | 200,000.00 |
| 14 | බීරගහඅරාව කොලලාවත්ත මාර්ගය ඉතිරි කොටස පස් කපා සංවර්ධනය කිරීම. | 500,000.00 |
| 15 | බෝගහකුඹුර කෘෂි මර්ගය කොන්ක්‍රීට් කිරීම. | 600,000.00 |
| 16 | ඉම කඳර මාර්ගය අලුත්වැඩියා කිරීම. | 1,000,000.00 |
| 17 | මුංමණ්ඩිය මාර්ගය ඇදකහවෙිපතන සිට කිරිමඩුතැන්න බෝධිය දක්වා පස් කපා සකස් කිරීම. | 600,000.00 |
| 18 | 04 කණුව යොධාඋල්පත මාර්ගය සංවර්ධනය කිරීම. | 700,000.00 |
| 19 | අල්පිටිය පානීය ජල යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම. | 500,000.00 |
| 20 | හුණුකැටපිටිය කටුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 600,000.00 |
| 21 | දඹගහවෙල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 300,000.00 |
| 22 | මැදගෙදර ඇඳගලයාය අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 300,000.00 |
| 23 | අකුරුකඩුව ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම. | 200,000.00 |
| 24 | බතල හේන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 1,200,000.00 |
| 25 | මොරහෙල වසම සඳහා බහු කාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීම. | 1,200,000.00 |
| 26 | බහු කාර්ය ගොඩනැගිල්ලේ පැති බැම්ම සැකසීම. | 1,200,000.00 |
| 27 | පිටමාරුව ගල්කරුතැන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 800,000.00 |
| 28 | ගෙවල් පහ මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 29 | මීගහකිවුල පොළ භූමියේ වැසිකිලියක් ඉදිකිරීම. | 200,000.00 |
| 30 | අම්බලම කහටගස්තැන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 31 | ගමගෙදරපිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 32 | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1,600,000.00 |

## අනෙකුත් කාර්තුව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලබන යෝජනා

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | වෙන් කළ මුදල (රු.) |
|---|---|---|
| 1 | කෙහොඹගහගෙදර ගිනිකටුගහ ජල යෝජනා ක්‍රමය. | 1,000,000.00 |
| 2 | ගල්ගේලන්ද අත්වැල් පාලම අළුත්වැඩියා කිරීම. | 1,000,000.00 |
| 3 | මීගහකිවුල සේවා පියස ඉදිකිරීම. | 1,000,000.00 |
| 4 | දාවරන්යාය ඇල අමුණ සංවර්ධනය කිරීම. | 1,000,000.00 |
| 5 | ග්‍රාමීය මාර්ග එකක් පස් කපා සංවර්ධනය කිරීම. | 500,000.00 |
| 6 | මීගහකිවුල ගල්වල පිට පාර කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 7 | අකුරුකඩුව ගම මැද පාර කොන්ක්‍රීට් කිරීම. | 600,000.00 |
| 8 | ප්‍රධාන මාර්ගයේ සිට අංක 15 ලයින් කාමර දක්වා කොන්ක්‍රීට් කිරීම. | 700,000.00 |
| 9 | එළමාන ළමා මධ්‍යස්ථානය අසල පාලමක් ඉදි කිරීම. | 900,000.00 |
| 10 | බහුකාර්ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම. | 300,000.00 |
| 11 | බලගොල්ල දෙහිගහමඩ ගල්ලිඳවත්ත මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම. | 700,000.00 |
| 12 | බලගොල්ල ප්‍රජාශාලා ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම. | 300,000.00 |
| 13 | ප්‍රජාශාලා ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම. | 300,000.00 |
| 14 | ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම. | 100,000.00 |
| 15 | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම. | 400,000.00 |
| 16 | දිග්ගොම්මන ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරීම. | 150,000.00 |
| 17 | වැවතැන්න ගමට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 1,200,000.00 |
| 18 | කුඩුමිරිස්කැටිය ප්‍රජා ශාලාව අලුත්වැඩියා කිරීම. | 300,000.00 |
| 19 | බහුකාර්ය ගොඩනැගිල්ලට වැසිකිළියක් හා ජල පහසුකම් ලබා දීම. | 200,000.00 |
| 20 | බහුකාර්යය ගොඩනැගිල්ලට වැසිකිළියක් ඉදි කිරීම හා ජලය ලබා දීම. | 600,000.00 |
| 21 | හෙලහේන මාර්ගය ඇරන්ද කඳුර ළඟ සිට පස් කපා සකස් කිරීම. | 700,000.00 |
| 22 | හුණුකැට පිටිය ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම. | 300,000.00 |
| 23 | වෙලන්ලන්ද කෘෂි ළිඳක් ඉදි කිරීම. | 600,000.00 |
| 24 | කෝමාරික ඇල හරහා 3 කණුව පාලාවත්ත ප්‍රදේශයේ පාලමක් ඉදි කිරීම. | 600,000.00 |
| 25 | අකුරුකඩුව ප්‍රජාශාලාවේ මිදුලට (ඉන්ටලොක් කැට) කොන්ක්‍රීට් ගල් ඇල්ලීම. | 100,000.00 |

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2022 වැඩ ලක්ෂයේ ඉහත සඳහන් යෝජනාවලිය TO මහත්තයා යවලා කොට්ඨාශයට අදාල මන්ත්‍රීවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 05 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

5) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් අවුරුදු උත්සවය සංවිධානය කිරීම ලොක්ගල් ඔය වැව්තාවුල්ලේ පැවැත්වීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මූලාසනය සභාව අමතමින් මම මේ අදහස වෙනස් කරලා තියෙනවා. මේ රටේ තියෙන ගැටළුකාරී තත්වය මත, කරනවා කියලා තීන්දුවක් අරගෙන නැහැ. හැබැයි මේක කරත් සභාවේ මුදල් ලබා ගන්නේ නැහැ. සභාවේ නිලධාරින්ගේ සහයෝගයක් පමණයි බලාපොරොත්තු වෙන්නේ.**

මීළගට මූලාසන සභාව අමතමින් යෝජනා අංක 06 ට අදාළ ලිපිය ඉදිරිපත් කරන ලදී.

6) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල නගර අලංකරණ ව්‍යාපෘතිය සඳහා යෝජිත යෝජනාවන් පහත සඳහන් යෝජනා සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.

1. මීගහකිවුල ප්‍රාදේශීය සභාව ඉදිරිපස නාම පුවරුව ඉදිකිරීම.
2. බදුල්ල මහියංගණ මාර්ගයේ 12 කණුව සැතපුම් කණුව අසල සිට මීගහකිවුල 14 කණුව ඉන්ධන පිරවුම්හල දක්වා මාර්ගය දෙපස පැළ සිටුවීම සහ ඒවා පවත්වාගෙන යාමට ජනතාවටගේ සහය ලබා ගැනීම.
3. මීගහකිවුල නගරයේ මල් පෝච්චි තබා පැළ සිටුවා ඒවා නඩත්තු කිරීමට වෙළඳ ප්‍රජාව සහ නගර වැසියන් යොමු කිරීම.
4. මීගහකිවුල නගරයේ හා නගරාසන්නව ඉදි කර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම.
5. මීගහකිවුල නගරයේ වීථි ලාම්පු සවි කිරීම.
6. මීගහකිවුල නගරාසන්නයේ ඇති අතුරු මාර්ග සඳහා මාර්ග නාම පුවරු සවි කිරීම.
7. නගරය අවට කසල බඳුන් තැබීම.

**මීගහකිවුල නගර අලංකරණ ව්‍යාපෘතිය සඳහා යෝජිත යෝජනාවන් ඉහත සඳහන් යෝජනා සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලාතා මැතිණිය ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රානුකූලව හදිසි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

<u>හදිසි යෝජනා</u>

මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 01 ඉදිරිපත් කරන ලදී.

01) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සතිපොළ පවත්වාගෙන යන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු: 112,171/= ක මුදලක් වැයවන ලෙසට

ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වියදම් සහා අරමුදලින් දැරීම සඳහා සහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සහා ගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල සතිපොළ පවත්වාගෙන යන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු: 112,171/= ක මුදලක් වැයවන ලෙසට ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වියදම් සභා අරමුදලින් දැරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 02 ඉදිරිපත් කරන ලදි.

02) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල නව බස් නැවතුම්පොලේ ඉහළ මහලේ කඩකාමර 04 පාටීෂන් කරන්නේ නැතුව බ්ලෝක් ගලෙන් තැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල නව බස් නැවතුම්පොලේ ඉහළ මහලේ කඩකාමර 04 පාටීෂන් කරන්නේ නැතුව බ්ලෝක් ගලෙන් තැනීම සඳහා TO මහත්තයාගෙන් ඇස්තමේතුවක් ගෙන ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 03 ඉදිරිපත් කරන ලදි.

03) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල නව බස්නැවතුම්පොලේහි මීට පෙර ටෙන්ඩර් ලබා සිටි අය වන එච්.එම්.ශ්‍රියා කුමාරි හේරත් මිය සහ කේ.ඩී.ජී.එම්.ගුණසිංහ මිය යන අය විසින් කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි බව දන්වා එම කඩ කාමරය පී.එච්.සචිත්‍රා නිශාදනි ජයවීර මිය හට පැවරීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**මීගහකිවුල නව බස්නැවතුම්පොලේහි මීට පෙර ටෙන්ඩර් ලබා සිටි අය වන එච්.එම්.ශ්‍රියා කුමාරි හේරත් මිය සහ කේ.ඩී.ජී.එම්.ගුණසිංහ මිය යන අය විසින් කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි බව දන්වා එම කඩ කාමරය පී.එච්.සචිත්‍රා නිශාදනි ජයවීර මිය හට පැවරීමේදී සභාවට අගතියක් නොවන පරිදි එම කටයුතු සිදු කිරිම සඳහා සභා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 04 ඉදිරිපත් කරන ලදි.

04) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් 2022 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහලෙහි වැඩ නිමාවී ඇති බැවින් සහ එමගින් අප සභාවට ආදායම් උපයා ගත හැකි බැවින්ද එම ගොඩනැගිල්ල බදු දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට ඊට ආදාලව සැකසූ ප්‍රසම්පාදන දැන්වීම් සඳහා සහ මීට ආදාලව තක්සේරුව සිදු කර මිල ගණන් තීරණය කරන තෙක් ප්‍රසම්පාදන දැන්වීමෙහි ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ ප්‍රසම්පාදන

කැඳවීම් ක්‍රියාවලිය සිදු කිරීමට අවශ්‍ය සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**2022 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහලෙහි වැඩ නිමාවී ඇති බැවින් සහ එමගින් අප සභාවට ආදායම් උපයා ගත හැකි බැවින්ද එම ගොඩනැගිල්ල බදු දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට ඊට ආදාලව සැකසූ ප්‍රසම්පාදන දැන්වීම් සඳහා සහ මීට ආදාලව තක්සේරුව සිදු කර මිල ගණන් තීරණය කරන තෙක් ප්‍රසම්පාදන දැන්වීමෙහි ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ ප්‍රසම්පාදන කැඳවීම් ක්‍රියාවලිය සිදු කිරීමට අවශ්‍ය සහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 05 ඉදිරිපත් කරන ලදි.

05) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් කුලී පදනම මත ලබා දෙන පහත සදහන් වාහන සඳහා දක්වා ඇති මිල ගණන් ඉන්ධන සහිතව සැපයීමට 2022 වර්ෂයේ ගැසට් කර ඇති අතර නමුත් වර්ථමානයේදී දිනෙන් දින ඉහළ යන ඉන්ධන මිල ගණන් හේතුවෙන් පහත දක්වා ඇති වාහන හා යන්ත්‍ර ගැසට් කර ඇති මිළ ගණන් යටතේ ලබා දීමෙන් විශාල මූල්‍යමය පාඩුවක් දැරීමට සිදු වන නිසා කුලී පදනම මත ලබා දෙන වාහන හා යන්ත්‍ර සඳහා ඉන්ධන රහිතව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

| වාහනය | දිනකට මිල (රු:) |
|---|---|
| පොඩි ගල් රෝල | 1750.00 |
| ලොකු ගල් රෝල | 2750.00 |
| බැකෝ යන්ත්‍රය | 2750.00 |
| ටිපර් රථය | 10000.00 |
| ට්‍රැක්ටර් | 5000.00 |

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් කුලී පදනම මත ලබා දෙන ඉහත සදහන් වාහන සඳහා දක්වා ඇති මිල ගණන් ඉන්ධන සහිතව සැපයීමට 2022 වර්ෂයේ ගැසට් කර ඇති නමුත් වර්ථමානයේදී දිනෙන් දින ඉහළ යන ඉන්ධන මිල ගණන් හේතුවෙන් ඉහත දක්වා ඇති වාහන හා යන්ත්‍ර ගැසට් කර ඇති මිළ ගණන් යටතේ ලබා දීමෙන් විශාල මූල්‍යමය පාඩුවක් දැරීමට සිදු වන නිසා කුලී පදනම මත ලබා දෙන වාහන හා යන්ත්‍ර සඳහා ඉන්ධන රහිතව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 06 ඉදිරිපත් කරන ලදි.

06) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල මහජන පුස්තකාල පොත් අස්ථානගත වීම සම්බන්ධව කටයුතු කිරීම සඳහා ඊට ආදාල චක්‍රලේඛන වලට අනුව එම පොත් පරිග්‍රහණ ලේඛණයෙන් කපා හැරීම සිදු කල හැකි අතර එම

කටයුතු සිදු සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල මහජන පුස්තකාල පොත් අස්ථානගත වීමට හේතු සඳහන් කර ඉදිරි සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සභාව විසින් තීරණය කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 07 ඉදිරිපත් කරන ලදි.

07) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ දෛනික වැටුප් ලබමින් සේවයට යොදවා ඇති එල්.ආර්.එම්.දූලින් ලක්සිරි මයා, ඩී.එම්.සංජීව නුවන් මයා,හා අරුණ ශාන්ත ජයතුංග මයා යන අය විසින් 2022 අලුත් අවුරුද්ද සඳහා උත්සව අත්තිකාරම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරි මහත්ම මහත්මීන් හට 2022 අලුත් අවුරුද්ද සඳහා උත්සව අත්තිකාරම් ලබා දිම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු අතර, ස්ථිර නොමැති සේවකයින් සම්බන්ධව උත්සව අත්තිකාරම් ලබා දීම සඳහා නීතියාණුකූලව යම් ක්‍රමවේදයක් සකසා ඉදිරි සභාවට වාර්තාවක් ඉදිරිපත් කර කමිටුව මඟින් තීරණයක් ගැනීමට ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 08 ඉදිරිපත් කරන ලදි.

08) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPF-5485 නිළ කැබ් රථය සඳහා 2022 පෙබරවාරි මස ලීටර් 90 අමතර ඉන්ධන අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**නිකුත් කර ඇති නව චක්‍රලේඛ බලා අවශ්‍ය පියවර ලබා ගැනීමට තීරණය කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 09 ඉදිරිපත් කරන ලදි.

09) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් අපි කරමැටිය පොලේ ලක්ෂ 49 කඩකාමර 03ක් හැදුවා. ඒකේ වැඩ අවසන් වෙලා තියෙන්නේ ඒකේ තව පොඩි ප්‍රමාණයක් තියෙනවා. නමුත් දැනට මුදල් වෙන්වීම තාම වෙලා නැහැ. ගම සමඟ පිළිසඳරක් සමඟ තමයි පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේකට වෙන් කරලා තියෙන්නේ. ඒ අරමුදල් එනකම් අපිට ටෙන්ඩර් කරලා ඒ මුදල් ටික ගෙවන්න ක්‍රමවේදයක් තියෙනවානම් කියන්න. කොන්ත්‍රාත්කරු හොඳටම අසරණ වෙලා ඉන්නේ. එම නිසා කොන්ත්‍රාත්කරුට හට අපට කල හැකි උපකාරය සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

මුලාසනයේ අවසරය ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා සභාව අමතමින් කෝන්ත්‍රාත්කරුට මුදල් හම්බ වුනේ නැති නිසා ප්‍රදේශයේ ජනතාව අසරණ වෙලා ඉන්නේ. ප්‍රදේශයේ ජනතාව තමයි වැඩ කරලා තියෙන්නේ. ඒක නිසා ඒ අයගේ මුදල් ලැබුණේ නැහැ කියලා මට කිපදෙනෙක් කිව්වා. ඒ වෙනුවෙන් කඩිනම් පියවරක් ක්‍රමවේදයක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

**පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන ලෙස සභාව විසින් තීරණය කරන ලද අතර ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මූලාසන සභාව අමතමින් මීළගට න්‍යායපත්‍රානුකූලව කාරක සභා වාර්තා සලකා බැලීම සම්බන්ධයෙන් 2022.03.08 වන දින මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

## 2022/03/08 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

2022/03/08 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා, ලේකම්තුමිය හා විෂය නිළධාරී පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට න්‍යාය පත්‍රාණුකූලව ගරු සභාපතිතුමා විසින් 2022.02.10 දිනැති පසුගිය රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා ස්ථිර කළේය.

න්‍යාය පත්‍රාණුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව 2022 පෙබරවාරි මස ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ අතර 2022 වර්ෂයේ පෙබරවාරි මස ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

පුංචි ලෝකාන්තය නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව සඳහා එහි අනාරක්ෂිත ස්ථානය ආවරණය වන පරිදි ආරක්ෂිත වැටක් ඉදිකිරීමේ වැඩ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රම දායකත්වය මගින් මේ වන විට ආරම්භ වී ඇත. ඒ අනුව එම ආරක්ෂිත වැට ඉදිකිරීමේ කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් සභා අරමුදලින් වියදම් දැරීමට  සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාවෙන් අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

මූලාසනය සභාව අමතමින් මීළගට න්‍යාය පත්‍රාණුකූලව 2022 පෙබරවාරි මස ආදායම්,වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

# මාසික ලැබීම් සාරාංශය

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**මාසය - 2022 පෙබරවාරි**

| ආදායම් ශීර්ෂය | ආදායම් ප්‍රභවය | මුදල (රු) |
|---|---|---|
| 1/71 | වැටුප් ප්‍රතිපූර්ණය | 2,056,249.63 |
| 1/71 | මන්ත්‍රී දීමනා | 270,000.00 |
| 1/13 | ව්‍යාපාර බදු | 59,400.00 |
| 1/62 | පෝරම ගාස්තු | 1,080.00 |
| 1/52 | උසාවි දඩ | 361,519.00 |
| 1/47 | වාහන නවතා තැබීමේ ගාස්තු | 10,000.00 |
| 1/63 | මුද්දර ගාස්තු | 187,695.00 |
| 1/64 | සේවක ණය (පොළී) | 142.33 |
| 1 | සේවක ණය | 2,711.34 |
| 2/12 | කර්මාන්ත බදු | 20,400.00 |
| 2/23 | පොදු පහසුතා මධ්‍යස්ථානය | 32,160.00 |
| 2/31 | බලපත්‍ර ගාස්තු | 70,950.00 |
| 2/62 | පෝරම ගාස්තු | 940.00 |
| 2/66 | බිම් කුළී සංචාරක මාළු වෙළදාම | 500.00 |
| 2 | තැන්පත් (වෙළද බලපත්‍ර) | 6,875.00 |
| 3/22 | තාවකාලික කඩ ලැබීම් | 1,000.00 |
| 3/21 | සභාව සතු ඉඩම් හා කුළී | 2,400.00 |
| 3/23 | ටෙන්ඩර් කඩ කුලී | 4,850.00 |
| 4/14 | ජල ලැබීම් | 100,516.00 |
| 6/15 | සභාව සතු ඉඩම් හා කුළී (පිටමාරුව පුංචි ලෝකාන්තය) | 42,000.00 |
| 6/52 | පුස්තකාල දඩ | 150.00 |
| 6/62 | අබලි ද්‍රව්‍ය විකිණීම /පුස්තකාල පෝරම ගාස්තු | 365.00 |
| 6 | තැන්පත් (පුස්තකාල තැන්පත් ගාස්තු/පිටමාරුව පුංචි ලෝකාන්තය 30% කොමිස් ගාස්තු) | 18,190.00 |

| | | |
|---|---|---|
| 5/23 | සතිපොළ ගාස්තු ලැබීම් | 229,147.50 |
| 5 | තැන්පත් (මීගහකිවුල සතිපොළ ටෙන්ඩර් ඇප තැන්පත් ගාස්තු ලැබීම්) | |
| 173 | අත්තිකාරම් පියවීම | 2,715.00 |
| | **වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම** | |
| 1/46 | බවුසරය කුලියට දීම | 7,500.00 |
| 3/43 | ටිපර් රථය කුළියට දීම | 24,000.00 |
| | **එකතුව** | **3,513,455.80** |

## 2022 පෙබරවාරි මස ගෙවීම් විස්තරය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව

| අනු අංකය | ගෙවන ලද දිනය | ගෙවීම්ලාභී නම හා විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 1 | 2022.02.01 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මහතා, ගරු සභාපති - ජනවාරි මස ගමන් වියදම් ගෙවීම. | 20,000.00 |
| 2 | 2022.02.01 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මහතා,රියදුරු - පළාත තුල හා පළාත පිට රාජකාරි වල නිරත වීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 9,100.00 |
| 3 | 2022.02.01 | වයි.එම්. නුවන් හර්ෂණ මහතා, රියදුරු - පිඹුරල් පොත සිට තල්දෙන තෙක් පස් ප්‍රවාහනය කිරීම සඳහා ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| 4 | 2022.02.02 | කළමනාකරු, මොබිටෙල් පුද්ගලික සමාගම - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ඊ.එස්.එම්.එස්. 2021 දෙසැම්බර් මස බිල්පත් පියවීම. | 61.30 |
| 5 | 2022.02.02 | සහකාර වානිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 055-2245775 දුරකතනයේ 2021 දෙසැම්බර් මස දුරකතන බිල්පත් පියවීම. | 2,834.18 |
| 6 | 2022.02.02 | සහකාර වානිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 055-2245890 දුරකතනයේ 2021 දෙසැම්බර් මස දුරකතන බිල්පත් පියවීම. | 2,526.11 |
| 7 | 2022.02.03 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මිය, සභා ලේකම් - ග්‍රාමීය මාර්ග රාජ්‍ය ආමාත්‍යාංශය වෙත යෑම වෙනුවෙන් ගමන් වියදම් ලබා ගැනීම. | 2,500.00 |
| 8 | 2022.02.03 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - ZA-5003 , 252-6368 , LL-7774 වන වාහාන අලුත්වැඩියා බිල්පත් පියවීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන( පුනරාවර්තන) මඟින් මුදල් ගෙවීම සිදු කරන තෙක් බිල්පත් වෙුවෙන් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 100,000.00 |
| 9 | 2022.02.07 | කළමනාකරු, රත්න සුපර් සිටි , මීගහකිවුල - සභා අරමුදලින් ද්‍රව්‍යාධාර ලබා දීම යටතේ ලබා ගත් ද්‍රව්‍ය බිල්පත් පියවීම. | 15,000.00 |
| 10 | 2022.02.07 | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරිපාලක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් 2021 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 |
| 11 | 2022.02.07 | සභා ලේකම් , ප්‍රාදේශීය සභාව , මීගහකිවුල - ග්‍රමීය මාර්ග 2021 වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග වල ලිපිගොනු වල ඡායාපිටපත් ලබා ගැනීම සඳහා A4 Bundle එකක් අතින් වියදම් දරා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1,180.00 |
| 12 | 2022.02.08 | එම්.ආර්.නිබන් මයා, 2022 ජනවාරි මස සඳහා පුංචි ලෝකාන්ත ආදායමෙන් 30% ක කොමිස් මුදල නිදහස් කිරීම. | 16,500.00 |
| 13 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - මීගහකිවුල ජල පොම්පාගාරයේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 15,374.20 |

| | | | |
|---|---|---|---|
| | | | |
| 14 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - තල්දෙන ජල පොම්පාගාරයේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 924.00 |
| 15 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - පැරණි කාර්යාලයේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 789.00 |
| 16 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - නව කාර්යාලයේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 2,692.20 |
| 17 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - පිටමාරුව මහජන පුස්තකාලයේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 276.60 |
| 18 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - බස්නැවතුම් පොලේ දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 349.80 |
| 19 | 2022.02.08 | ආදායම් ගණකාධිකාරි (ඌව) ,ලංකා විදුලිබල මණ්ඩලය - වීථි ලාම්පු දෙසැම්බර් මස විදුලි බිල්පත් පියවීම. | 1,704.00 |
| 20 | 2022.02.10 | ආර්.එම්.මදුසිකා රත්නායක,සංවර්ධන නිලධාරි-බදු ගිවිසුම් පිළිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන සඳහා පළාත පාලන දෙපාර්තමේන්තුවට යෑමේ ගමන් වියදම් ගෙවීම. | 860.00 |
| 21 | 2022.02.10 | ආර්.එම්.සමන් මනුප්‍රිය,යන්ත්‍ර සහයක-ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි කැබ් රථයට අමතර කොටස් රැගෙන ඒමට ගිය ගමන් වියදම් ගෙවීම. | 2,004.00 |
| 22 | 2022.02.10 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව,මීගහකිවුල-පෙබරවාරි මස මුදල් කමිටු දීමනා ගෙවීම. | 2,000.00 |
| 23 | 2022.02.10 | ඩබ්.එම්.ජයලත් මයා-ගරු සභාපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් දීමනාව ගෙවීම 2022 ජනවාරි මස | 10,000.00 |
| 24 | 2022.02.10 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව,මීගහකිවුල- සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරිම | 4,975.00 |
| 25 | 2022.02.10 | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද යන්ත්‍ර සහකාර සහ යන්ත්‍ර ක්‍රියාකරු 2022 ජනවාරි මස වැටුප් ගෙවීම. | 98,736.65 |
| 26 | 2022.02.10 | ආදේශක වැටුප් ගෙවීම-2022 ජනවාරි මස | 70,636.51 |
| 27 | 2022.02.10 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මිය, සභා ලේකම් -2022 ජනවාරි මස රජයේ නිවාඩු දින වල සේවය කිරිම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලබා ගැනීම. | 6,803.25 |
| 28 | 2022.02.11 | ටී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගාරජ් - LL-6984 ටිපර් රථයේ ක්ලච් ප්ලේට් අලුත්වැඩියා කිරිම සඳහා ගෙවීම. | 65,500.00 |
| 29 | 2022.02.18 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 පෙබරවාරි මස මහ සභ රැස්වීම් සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් මුදලක් ගැනීම. | 11,000.00 |
| 30 | 2022.02.18 | සහකාර වාණිජ්‍ය අධිකාරි ශ්‍රී ලංකා ටෙලිකොම් ,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245890 දුරකතන බිල 2022 ජනවාරි මස බිල්පත් පියවීම. | 2,633.87 |
| 31 | 2022.02.18 | සහකාර වාණිජ්‍ය අධිකාරි ශ්‍රී ලංකා ටෙලිකොම් ,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245775 දුරකතන බිල 2022 ජනවාරි මස බිල්පත් පියවීම. | 3,270.78 |
| 32 | 2022.02.18 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලිබල මණ්ඩලය- මීගහකිවුල ,ප්‍රාදේශීය සභාව සතු පිටමාරුව පුස්තකාලයේ 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 276.60 |
| 33 | 2022.02.21 | මන්ත්‍රී දීමනා -2022 පෙබරවාරි මස | 294,000.00 |
| 34 | 2022.02.21 | ජේ.එම්.විජිත ප්‍රියන්ත මහතා,රියදුරු -ලේකම්තුමිය සමඟ කොළඹ රාජකාරි යෑම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 1,750.00 |
| 35 | 2022.02.21 | ජේ.එම්.විජිත ප්‍රියන්ත මහතා,රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පාලත තුල හා කොළඹ යෑම වෙනුවෙන් අත්කාල දීමනා ගෙවීම | 10,096.00 |
| 36 | 2022.02.21 | ඩී.එම්.සංජීව නුවන් මයා - 2022 ජනවාරි මස ඉටු කල සොවාවන් වෙනුවෙන් වැටුප් ගෙවීම. | 19,759.84 |

| | | | |
|---|---|---|---|
| 37 | 2022.02.21 | වයි.එම්.රුවන් චාමර මයා - UPLL6984 ටිපර් රථයේ ස්පෙයාර් වීල් බ්‍රැකට් /ජියර් බුස්/බලු වැට/වම්පස දොර ලොක් සැදීම සඳහා ගෙවීම කිරිම. | 4,800.00 |
| 38 | 2022.02.22 | සභා ලේකම් , ප්‍රාදේශීය සභාව , මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු LL-7774 කෘෂ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 9,000.00 |
| 39 | 2022.02.22 | ඉම්ටියාස් පකීර්ඩීන්, නො 05, පහළ වීදිය,බදුල්ල.- මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් දින මුද්‍රාවක් සකස් කිරිම. | 2,950.00 |
| 40 | 2022.02.22 | ඩී.එම්.ජයන්ත ගුණසේකර, ලිහිණි මාවත, මීගහකිවුල.- 2021 වර්ෂයේදී මීගහකිවුල බස් නැවතුම්පල නව ටෙන්ඩර් ලබා ගැනීමේදී තැබූ ඇප මුදල් නිදහස් කිරිම වෙනුවෙන් ගෙවීම. | 25,000.00 |
| 41 | 2022.02.22 | කේ.අසංක සම්පත් සිල්වා මයා,පන්සල පාර,මීගහකිවුල.-2022 වර්ෂයේදී මීගහකිවුල බස් නැවතුම්පල නව ටෙන්ඩර් ලබා දීමේදී තැබූ ඇප මුදල් නිදහස් කිරිම වෙනුවෙන් ගෙවීම. | 25,000.00 |
| 42 | 2022.02.24 | රාජක්‍රිෂ්ණන් තනලෙච්චමි මිය, රෝබේරිය.-2021 ඔක්තෝම්බර්,නොවැම්බර්,දෙසැම්බර් සහ 2022 ජනවාරි මස වල සභා වාර්තා දෙමළ භාෂාවට පරිවර්තනය කිරිම වෙනුවෙන් ගෙවීම් කිරිම. | 20,000.00 |
| 43 | 2022.02.24 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මිය - සභා ලේකම් 2022 ජනවාරි මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 2,500.00 |
| 44 | 2022.02.25 | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා 2022 ජනවාරි ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරිම. | 141,490.00 |
| 45 | 2022.02.25 | නව අභ්‍යාස ලාභී උපාධිධාරි එස්.එම්.නවෝදා දිලිනි මෙනවියගේ 2022 පෙබරවාරි මස වැටුප් ගෙවීම. | 44,875.60 |
| 46 | 2022.02.25 | කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම- 2022 පෙබරවාරි මස | 1,967,990.59 |
| 47 | 2022.02.25 | ආර්.එම්.දුමින්ද පියරාජ් මයා,ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 ජනවාරි මස මෙම කාර්යාලයේ පොදු පහසුකා මධ්‍යස්ථානයේ සේවය කිරිම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 13,584.89 |
| 48 | 2022.02.25 | අරුණ ශාන්ත ජයතුංග මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 ජනවාරි මස මෙම කාර්යාලයේ දෛනිකව සේවයේ යෙදවීම වෙනුවෙන් වැටුප් ගෙවීම. | 24,699.80 |
| 49 | 2022.02.25 | කේ.වී.ජී.රෝහණ මයා ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 ජනවාරි මස කැබ් රථයේ සේවය කිරිම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 12,349.90 |
| 50 | 2022.02.25 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් කාර්යාලය, මුද්දර බදු අංශය,කොළඹ -02 - 2021/10/17 , 2021/11/24 , 2021/12/20 යන දිනයන් වල මෙම කාර්යාලයේ නිලධාරි මහත්ම මහත්මීන්ගෙ අය වැටුපෙන් කරන ලද මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස්තුමා වෙත ප්‍රේෂණය කිරිම. | 3,350.00 |
| | | **මුළු එකතුව** | **3,101,804.67** |

**2022 පෙබරවාරි මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සම්මත කිරීමට සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතවය මත 2022 පෙබරවාරි මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා**

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් රු: 75000.00 යෝජනාව සම්බන්ධව මේ වෙන කොට තත්වය දැන ගන්න කැමති.

මූලාසනය සභාව අමතමින් මං ලඟ 4ක් විතර තියෙනවා. අත්සන් කර ගන්න බැරි වුනා. ඒ ටිකත් දාලා දිලා තියෙන ටික දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා**

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් ඉතාමත් අභාග්‍යමත් කාලයක් ගෙවමින් පවතින්නේ ලංකාවට. මං හිතන්නේ දේශපාලන කතාවක් නෙමෙයි. නමුත් මට මතකයි යහපාලන රජය තියෙද්දි නම් අපේ පලූ ඇරියා කට්ටිය සමහරු. නමුත් ඉතින් වෙලා තියෙන තත්වයට හැටියට අද උදේ දැනගන්න ලැබුනා කනගාටු දායක කාරණාවක් විශේෂයෙන් පෝලිම් වල ඉන්න තරුණයෙක් මිය ගිහින් තියෙනවා අද පාන්දරම වතුපිටිවල රෝහලේදී පොලිමේදී ඇති වු ගැටුමක් නිසා මිය ගිහිල්ලා තියෙනවා කියලා ඉතාම කණගාටු දායක තත්වයක් වතුපිටිවල ප්‍රදේශයේ. මම හිතන්නේ මීගහකිවුල ප්‍රදේශයේ ඒ වගේ මේ වෙන කොට තෙල් අර්බුදයක් පැන නැගිලා තියෙනවා. අපි ආවට හවස ගෙදර යන්න වත් තෙල් නැහැ දැන් මගේ වාහනෙත්.ඒ ගැන හොයලා බලලා අපිට තියෙන එකම ඉන්ධන පිරවුම්හලට මොනවා හරි ක්‍රමයකින් ප්‍රදේශයේ ජනතාවගේ ගැටලු විසඳන්න කියලා ඔබතුමා මැදිහත් වෙයි කියලා බලාපොරොත්තතු වෙනවා.

ඒ වගේම රු:75000.00 යෝජනාවේදි සිමෙන්ති ආධාර අපි ඉල්ලපු කට්ටියට ලොකු ගැටලුවක් ඇති වෙලා තියෙනවා මේ සිමෙන්ති මිල සීඝ්‍රයෙන් වැඩි වෙනවා. රු:1350.00 තියෙද්දී මේ යෝජනා ලබා දුන්නේ. නමුත් දැන් වෙනකොට රු:2000.00 ට ආසන්න වෙනවා. සිමෙන්ති කොට්ට 5ක් දීපු කෙනාට සිමෙන්ති කොට්ට 2ක් දෙන්න වෙන්නේ. ඒ නිසා අපට පුලුවන් සභාපතිතුමා අපිට මේ ආවරන යටත්ව අපට බඩු දෙන්න පුලුවන් ඇති.

මූලාසනය සභාව අමතමින් මම ලේකම් තුමියට කියන්නම්. අපිට එහෙ අනුමත වෙලා තිබුනොත් ඔබතුමිය අපි ආවරන අනුමැතිය යටතේ දෙමු.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් මම නම් ඔක්කොම ලිපි ලේඛණ සම්පූර්ණ කරලා තියෙන්නේ අපි සිමෙන්ති ආධාර දෙන්න පොරොන්දු වුනේ.

එතකොට නල ළිං වැඩේ කෙරුනේ නැහැ මම හිතන්නේ නල ළිං හැරුවා. එකේ පොම්ප ටික ගිය සභාවේදීත් යෝජනා කරා එවා ඇවිල්ලා තියෙනවා කියලා කිවුවා.

මූලාසනය සභාව අමතමින් මේ සභාවට නිකම් දිලා තියෙන්නේ. අපි පක්ෂ පාට බලන්නේ නැතුව ඇමතිතුමා දුන්නේ. ඒක නිසා ඔබතුමාගේ කණ්ඩායමට කියන්න අපේ කණ්ඩායමත් තෙක්ක එකතු වෙලා ඔබතුමා ඒ ටික කර ගන්න.අපි දන්නවා උප සභාපතිතුමා ඊයේ පෙරේදා වතුර එකක් දුන්නා 11 කණුවේ නල ළිඳක් ගැහුවා. දැන් ඒ පැත්තේ මිනිස්සුට මේ පැත්තේ මිනිස්සු වතුර දෙන්නේ නැහැ කියලා ඊයේ පෙරේදා මුළු ගමම මෙහේ ආවා. එතකොට ගමේ මිනිස්සුන්ගේ හැම අවශ්‍යතාවයක්ම අපිට සපුරන්න බැහැ. මම කිවුවා ඔයගොල්ලෝ එකතු වෙන්න රැස්වීමක් දාගන්න මම එන්නම්. නල ළිඳෙන් වතුර ගන්නේත් ඒගොල්ලෝමයි. ලයින් එකේ වතුර ගන්නේත් ඒගෝල්ලන්ලු.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් තාක්ෂණ නිලධාරි ඇවිල්ලා ස්කෑන් කරපු තැනනේ ගැහුවේ.

මූලාසනය සභාව අමතමින් ඔබතුමා අපේ වැඩපරිපාලක සම්බන්ධ කරගෙන ඒ වැඩ ටික කර ගන්න.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් මීගස්පිටිය කොහාන මාර්ගය ඒකේ Photo ටිකකුත් ගහගෙන ආවා. මේ පාර අවුරුදු 02ක කලින් හදපු පාර. මේක මම ගම්පෙරලිය ව්‍යාපෘතියෙන් හදපු පාර. මෙගොල්ලෝ ඉස්සල්ලාම කරේ දවස් 2ක් විතර JCB එක දාලා සම්පූර්ණ කැඩුවා. මං හිතන්නේ මීටර් 500ක් 600ක් විතර මුළු ඉදලම කැඩුවා සම්පූර්ණ කෙලවරට වෙනකම්. දැන් පයින්වත් යන්න බැහැ. විශේෂයෙන් මේ කොහාන ප්‍රදේශයේ ජනතාව පාවිච්චි කරන්නේ මේ මීගස්පිටියට ප්‍රාථමික විද්‍යාලයට ඒ ළමයි එන්නේ. ඒ කුඩා ළමයිට පයින් වත් එන්න බැහැ. කොන්ක්‍රීට් කබොල් අස්සේ කකුල් යනවා. එතකොට අපි මේකට ගන්න විසඳුම මොකක්ද. ඒදායින් පස්සේ JCB එකක් ඒ පැත්ත පලාතේ ගියේ නැහැ කැඩුවා කැඩුවමයි ඒ මිනිස්සු ගියා කොහේ ගියාද කියලා දන්නේ නැහැ.

මුලාසනය සභාව අමතමින් රුහුණු කන්ට්‍රක් සමාගම ඕක කරන්නේ. ඔබතුමාගේ letter head එකෙන් ලියුමක් ගහන්න. රුහුණු කන්ට්‍රක්ෂන් එක මොකද කරන්නේ කන්ට්‍රැක් අරගෙන උප කොන්ත්‍රාත්කාරයෝන්ට පාරවල් දීලා පාර කනවා. මේ ඔබතුමාට තියෙන ප්‍රශ්නයක් නෙමෙයි මාර්ග ඔක්කෝම එහෙමයි. ඇමතිතුමාට මම පැහැදිලිව කිව්වා ඇමතිතුමා කතා කරලා අද හෙටම රැස්වීමක් ගනියි. මේ රජයට දොස් කියලා වැඩකුත් නැහැ. මේවා මේ කොන්ත්‍රාත්කාරුවෝ කොළඹින් ඇවිල්ලා අපේ ගමට සාධාරණයක් ඉෂ්ඨ කරන්නේම නැත. හැම පාරක්ම ප්‍රශ්න. බදුල්ලේන් මහියංගණයෙන් ආපු අය වැඩේ හරියට කරලා ගියා. රජයේ වැරැද්දක් නෙමෙයි. මේක මේ කොන්ත්‍රාත්කාරයෝ කරන්නේ නැතිකමක් තියෙන්නේ. මේකේදී ඕන දෙයක් කරන්න අපිත් එන්නම් ප්‍රශ්නයක් නැහැ. සභාවක් වශයෙන් ලියුම් ගැහුවා ගිහිල්ලා කතා කරා. ඒයාලා Phone answer කරන්නේ නැහැ. එයාලා වැඩ කරන්නේ නැහැ. ටෙන්ඩර් එක දුන්නේ ප්‍රාදේශීය සභාවෙන් නෙමෙයි මාර්ග ආමාත්‍යාංශයෙන්.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා සභාව අමතමින් මේකේ මූලිකත්වය අරගෙන කරලා තියෙන්නේ RDA එක. එයාට පැහැදිලි වගකීමක් තියෙනවා ඒ මාර්ග ටික හරි විදිහට කරලාද කියලා බලන්න.

මුලාසනය සභාව අමතමින් ඔබතුමා ඇයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට එන්නේ නැත්තේ ඔබතුමා ඇයි මේ යෝජනා ගෙන්නේ නැත්තේ ඒ කමිටුවට. මේ සියළු ප්‍රශ්න කතා කරන තැන තමා එතන සභාවෙන් යන දේවල් වලට අමතර යන දේවල් ගැන කතා කරන තැන තමයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව.එතන කතා කරන්න බැරිනම් ඔබතුමාට තවත් අවස්ථාවක් තියනවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව. අපිට මේ දෙකේ කතා කරන්න පුලුවන් ඔබතුමා ඔය කියන යෝජනා ටික ඔබතුමා මේ සැරේ දාන්න පහුගිය කාලේ අපේ මන්ත්‍රීතුමා දැම්මා යෝජනා.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම් සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් සමන්ත මන්ත්‍රීතුමා මම දැන් RDA කතා කලා AD මහත්තයා කිවුවා හෙටම බේකර් ගහලා තියෙන කැල්ලට ගල් කුඩු හරි ගල් හරි දාල රෝල දාන්න කටයුතු කරනවා කියලා තාවකාලිකව.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා</u>

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් මම මුලින්ම සුභාශිංසනය කරනවා අපේ අලුත් ලේකම් තුමියට. අපිත් තෙක්ක තව කොච්චර කාලයක් අපි ඉදීද කියලා අදහසක් නැහැ. ඒ ඉන්න කාලේ තුල අවශ්‍ය කටයුතු ඉතාමත් සහයෝගයෙන් හොඳින් කර ගෙන ගිහිල්ලා මේ මීගහකිවුල ප්‍රදේශයට යම් සේවයක් කිරීම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම හිටිය ලේකම්තුමිය අපෙන් සමුගෙන ගියා. මොනමොන මත ගැටුම් තිබුණත් එතුමියත් එතුමිගේ කාලය තුල මේ මීගහකිවුල ප්‍රදේශයට යමක් කරන්න හැකි ශක්ති ප්‍රමාණයක් අවශ්‍ය උත්සහය ගත්තා. එතුමියටත් ගිය ස්ථානයේ

රාජකාරි කටයුතු සාර්ථක කරගෙන ඒ ඉදිරිකාලය ගත කරන්න අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

මම මාස කිහිපයකට කලින් මේ ගරු සභාවට ඉදිරිපත් කරා තල්දෙන ප්‍රදේශයේ කේ.එම්.සුගතපාල මයා ආබාධිත පවුලක්. සභාව ගානේ අදාල මූලික ගාස්තුව නොමැතිව මාසික බිල් අය කිරීමක් කර ගමු කියලා. මොකද මම මන්ත්‍රී ප්‍රතිපාදන වලින් මුදල් වෙන් කරන්න හදන කොට ඔබතුමා කිව්වා නෑ මේක සභාවෙන් දෙමු.දෙන්නම ආබාධිතයි. අනුමැතිය හම්බ වුනා. හැබැයි අදින් අද වෙනකම් එතැනින් එකට මොකද වුනේ කියලා දන්නේ නැහැ. ඒ හින්දා මේක ඉක්මනින් වෙන්න ඕනි. දැන් වතුර අඩු වී ගෙන නැතිවී ගෙන යන්නේ. අවුරුදු ගණනක් තිස්සේ ඒ මනුස්සයා කතා කරන ප්‍රශ්නක්. දෙන්නා ජීවත් වෙන්නේ ආබාධිත දීමනා රු:5000/= ඒ හින්දා ඔබතුමා මැදිහත් වෙන්න. සල්ලි බැදපු ඒවාට දවස් 03යි ගියේ ඒකේ ජල සම්බන්ධතාවය දුන්නා. අදම මැදිහත් වෙලා මේක නිවැරදි කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒවගේම මම ඒ එක්කම ඉදිරිපත් කරා මෙවර අයවැයෙන් යම් මුදලක් වෙන් කරා සුසාන භූමි සඳහා. පහුගිය කාලේම වෙන් කරපු මුදල් පාවිච්චි වුනේ නැහැ. මම ඊට පස්සේ යෝජනාවක් දුන්නා තල්දෙන අපේ සුසාන භූමි 02ක් තියෙනවා බතලවත්ත, ගල්ගේලන්ද පාරෙයි. ඒ දෙක මැනීම් කටයුතු කරලා දෙන්න කියලා යෝජනා කරලා තියෙනවා. ලියුම කොතන තියෙනවාද ඒකට උත්තරක් හෝ මේ දේ වෙනවා හෝ කිසිම කාරණයක් මේ වන තෙක් දැනගැනීමට නැත. ඔබතුමා පොඩ්ඩක් අධීක්ෂණය කරලා ඒ සම්බන්ධයෙන් කාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. ඒවගේම සභාවට ඉදිරිපත් වන යෝජනා පහලට ගියාම ඔබතුමිය ඒ ටික අරගෙන පොඩ්ඩක් බලලා ක්‍රියාත්මක වන තැනට ගන්න කියන කාරණාව ඉල්ලා සිටිනවා.

ආදායම් විස්තරයේ තියෙනවා ලොකු ගල් රෝල ලොකු මුදලක් අය වෙන්න. අපිට ඒක RDA එකෙන් මේ වෙලාවේ ගැනීමේ හැකියාවක් තියෙනවා නම් අපිට ගොඩක් ප්‍රශ්නයක් ටිකක් අඩුවෙයි.

මූලාසනය සභාව අමතමින් ඊයෙ පෙරේදා ආවා. RDA එකේ සල්ලි නැහැ කියලා තමයි කියන්නේ. ඒක නිසා රෝල ගෙන්න කිව්වා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් සල්ලි නැත්තම් දිගටම තියෙන එකේ තේරුමක් නැහැනේ.

මූලාසනය සභාව අමතමින් අපිට තෙල් ගහන්න බැහැ ඒවාට.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ලොකු වියදමකුත් දරනවානේ. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒවගේම මීගහකිවුල කලාප කාර්යාලයෙන් මටත් කතා කරා ඔබතුමාටත් කතා කරා මට ලියුමක් එවලා තියෙනවා පානීය ජල අවශ්‍යතාවයක් සම්බන්ධයෙන්. ඔබතුමාට ඒක ඉදිරිපත් කරන්න කියලා.

මූලාසනය සභාව අමතමින් TO මහත්තයාගෙන් වාර්තාවකුත් ගෙන්න මම යැව්වා. ලියුම යවලා ඉවරයි.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් එවගේම අපි දැඩි අර්බුදයක ඉන්නේ මේ වෙලාවේ මේක ගොඩ එන්න සියළු දෙනාම යම් යම් කැප කිරීම් කරන්න වේවි. හැබැයි ලංකාවේ අපි දකින විදිහට එහෙම කැප වීමත් කරන්න සූදානම් පිරිසක් අපේ ජනතාව අතර නැහැ. ජනතාව අතර හිටියත් ඒ තැනට යන්න අවශ්‍ය මඟ පෙන්වන්න අර්බුදය දේශපාලනීය කර ගෙන තියෙන්නේ. තෙල් පොලිමේ මම දැක්කා අත්දැකීමක් මීගහකිවුලේ අපේ තල්දෙන ප්‍රදේශයේ පුද්ගයාට තියෙන්නේ ඩිමෝ බට්ටෙක්. කරන්නේ ළමයා ඉස්කෝලේට ගෙනත් දාන එක ගෙදරට ඇරන් යනවා. නෝනා යනවා පොලිමේ ලීටර් 20 කෑන් 04ක් අරගෙන මහත්තයා ගිහිල්ලා ලොරිය full කර ගන්නවා උඩ බස් හොල්ට් ඒකේ ලොරිය ගහලා ආය මහත්තයා යනවා 20 කෑන් 04ක් අරගෙන පොලිමේ යනවා. මන්සුස්යා ගෙදර ගිහිල්ලා තෙල් ටික

විකුණනවා. සෙඩ් එකේ වගේ එකක් තියා ගෙන. එවැනි වාතාවරනයක් තියෙනවා. ඒ හින්දා පාර්ලිමේන්තුවේ ඉන්න 225ටත් බැනලා පලාත් සභාවේ ඉන්න ටිකටත් බැනලා මෙතන ඉන්න අපිටත් බැනලා මේක විසඳගන්න බැහැ. අපි සියළු දෙනාම එකතු වෙලා මේක විසඳගන්න ඕනි ප්‍රශ්නයක්. මොකද තෙල් අපේ ලිඳෙන් එන්නේ නැහැ. ගෑස් අපේ ලිඳෙන් එන්නේත් නැහැ.ඒවගේම ගෑස් කතන්දරේ කියපුවාම එක්තරා ගෙදරකට ගියා ඒ වත්තේ තියෙනවා දර හත් අවුරුද්දකට උයන්න. නෝනා එනවා ග්වුස් දාගෙන මහත්තයා හම්බ වෙන්න එන්නේ. මම ඇහුවා ග්වුස් දාගෙන ඊට පස්සේ කිව්වා දර වලින් උයපුවාම දැලි ගැවුනාම නියපොතු සවුත්තු වෙනවාලු. එවැනි මානසික තත්වයක ඉන්න මිනිස්සුත් අපි අතර ඉන්නවා. ඒ හින්දා තමයි කිව්වේ.අපි මේක දේශපාලණිය කර ගන්නේ නැතුව මේ අර්බුදය දැක්කා. ජනාධිපතිතුමා අන්තිම වේලාවේ කොරෝනා යම් මර්ධනයකට ගෙනල්ලා රට විවෘත කරන කොට අපේ කට්ටිය එලියට බැහැලා පෙලපාලි යන කොට උද්ඝෝෂණය කරන කොට ආය කොරෝනා වැඩි වෙන කොට රට වහන්න කියලා අනෙක් උද්ඝෝෂණය කරන කොට ජනාධිපතිතුමා කිව්වා ජාතිය අමතලා කිව්වා අපිට කැප කිරීමක් කරන්න වෙයි . මේ වේලාවේ රට වැහුවොත් අපිට ඉස්සරහට අර්බුදයක් එනවා. හැබැයි ඉතින් ඇහුවේ නැහැ. රට වහන තැනටම ගෙනවා. ඒ හින්දා මම කිව්වේ මේක දේශපාලනයේ දැන් ගොඩක් දෙනෙකුට අමතකයි. දැන් කොරෝනා මරණ එකක් දෙකක් තිනේනේ ලංකාවම එන්නත්කරණය කරා කියන්න අමතකයි ඒවා සල්ලි දීලා ගෙනාවේ කියලා අමතකයි ඒ වගේ ගොඩාක් දෙවල් ගොඩාක් දෙනකුට අමතකයි දැන් අර ප්‍රභාකරන් කියපු කතාව මම දැක්කා ඊයේ පෙරේදා විඩියෝවක් ඒ මනුස්සයා දෙමලෙන්ම කියනවා ප්‍රභාකරන් කිවුවේ හරි දේ කියලා මිනිස්සුන්ට අපිට දවස් 07ක් 04ක් 05ක් තමා මතක තින්නේ ඒ නිසා අපි සියළු දෙනා එකතු වෙලා මේ අර්බුදයෙන් ගොඩ එන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනි නැත්තම් අපිට අමාරුයි මේකෙන් ගොඩ එන්න.

ඒ වගේම පාරවල් ගැන කතා කලා අපේ මේ පටන් ගත්තේ යම් විශාල පාරවල් ප්‍රමාණයක් වැඩ අවසන් කරලා තියෙනවා. කිහිපයක අපිට ගැටළු තියෙනවා. ඔබතුමා කිව්වා පොල්ගහඅරාව පාර දැන් ඒකට එදා කතා කරා මං හිතන්නේ විසඳුමක් ආවා. එකේ බෝඩ් එකක් මාරු කරලා. හැබැයි දැන් ඒකේ කොන්ක්‍රීට් දාන්න අමාරු නිසා කාපට් දාන්න අවසරය දීලා තියෙනවා සම්බන්ධීකරණ කමිටුවේදී අපි කතා කරා RDA එක හිටවලා කතා කරා. ඉතින් එතැනට එන්න ඕනි. ඒක තමයි අපිට කතා කරන්න තියෙන සියළුම නිලධාරින් එකතු වෙන තැන. එතැනදී මගේ ගැටළු ටිකක් තිබ්බා මම කතා කරා. නිමල් මන්ත්‍රීතුමා කතා කරා. ගිය අයගේ ගැටළු ටික ඒ අදාල නිලධාරින් එක්ක කතා කරගෙන අපි විසඳ ගත්තා. දැන් 2019ට 2020 ඉස්සල්ලා පටන් ගත්ත පාරක්. අපේ තියෙනවා 5ක් ද 6ක් ද. අදටත් යන්න බැහැ තිබ්බ පාර කඩලා. ඒ පව් ගෙවන්න වෙන්නේත් අපි. ගල්ගේලන්ද පාර, බතලවත්ත පාර, පොල්ගහඅරාව පාර, වෙලන්ලන්ද නම් යන්තම් ඉවරයි. ඒවගේ අපේ ආණ්ඩුකාලේ පටන් ගත්ත ඒවා නෙවෙයි තාම ඒවා ඉවරත් නැහැ. එදා මම ගල්ගේලන්ද පාරේ ගැටළුවක් තිබ්බා පුද්ගලිකව මැදිහත් වෙලා නම්බර් හොයලා ප්‍රාදේශීය ලේකම්ටත් කියලා බණ්ඩාරවෙලින් ගෙන්න ගත්තා I Road ඉංජිනියර්, කොමති එක ගෙන්න ගත්තා අපි ඒ ගැටළු ටික විසඳගත්තා. අපේ RDA එක හරහා යන අනිත් පාරවල් වල තියෙන ගැටළු හින්දා ඒ අදාල තැන්වලට ආවා නම් අපිට නිවැරදි විදිහට ඒ ටික කතා කර ගෙන මේ ගමන අපිට යන්න පුළුවන් ඒ අපි පටන් ගත්ත ඒවා නෙමෙයි. අපේ ආණ්ඩුවට කලින් පටන් ගත්තේ.

මුලාසනය සභාව අමතමින් අපේ ආණ්ඩුවේ යෝජනා.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් අපි කලින් දීපු යෝජනා පටන් ගත්තේ යහපාලන ආණ්ඩුවෙන්. අදටත් 2017 දී පටන් ගත්තේ. අදටත් ඇදි ඇදි යනවා. ඒ හින්දා අපි මේ වෙලාවේ ඔක්කෝම දේශපාලන පාට කණ්ණාඩිය පැත්තකින් තියලා අපේ ගමන යන්න ඕනි එකතු වෙලා. මම ඉල්ලීමක් කරනවා අපි සියළු දෙනාම එකතු වෙලා මේ ගමන ගිහිල්ලා මේ මීගහකිවුල හා සමස්ථ රටේ ජනතාව වෙනුවෙන් පැහැදිලි දෙයක් කරන්න අවශ්‍ය ශක්තිය ධෛර්‍යය අපි සියළු දෙනාම ලබා ගමු. අපිට තව අවුරුදු 03ක් තියෙනවා. සජිත් මහත්තයා ඉල්ලුවාට ජනාධිපතිවරණය දෙන්නේ නැහැ. ඒ හින්දා අවුරුදු 03ක් අපිට තියෙනවා. ඒ අවුරුදු 03 තුල තව මාස කිහිපයක් යනකොට මේ රටේ තියෙන තත්වය ලෝක තත්වය

වෙනස් වෙනවා. අපිට ගොඩක් දුරට හැකියාවක් ලැබෙයි සාමාන්‍යකරණයට එන්න. ඒ අනුව මේ වර්ෂයේ ඉන්න කාලයේ තුල යමක් කරමු කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා</u>

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා සභාව අමතමින් ඒවගේම පළමුව සුභාසිංශනය පුද කරනවා අලුතින් පත් වෙලා ආපු අපේ නව ලේකම්තුමියට සභාවේ කටයුතු මැනවින් කරගෙන ඉදිරියට සභාව කරගෙන යාම සම්බන්ධව.

මාගේ පුංචි යෝජනාවක් තියෙනවා. අපි මීට ඉස්සල්ලා ප්‍රධාන මාර්ගයේ දෙපස රුක් රෝපණ ව්‍යාපෘතියක් කරා. මං හිතන්නේ මෑත කාලයේ පාර ශුද්ධ කරද්දී අපි හිටවපු ගසුත් එක්ක කපලා තියෙන්නේ. ඉතින් අපි නැවතත් ආපසු යෝජනාවක් විදිහට ස්ථිර කරගෙන තියෙනවා. තල්දෙන ඉඳන් 16 කණුව දක්වා මේ රුක් රෝපණ වැඩසටහන. මං හිතන්නේ දැන් යම් යම් ප්‍රමාණයකින් මේ ශාක ආරක්ෂා කර ගන්න පුංචි ආරක්ෂිත රාමුවක් සකස් කරා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

මුලාසනය සභාව අමතමින් ඒකත් එක්ක තමයි මේ වැඩේ කරන්නේ.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා සභාව අමතමින් ඒවගේම තමයි අර්බුදකාරී තත්වයක් කියලා අපි කියනවා. සෑහෙන ජනතාවට පීඩනය වැඩි වෙලා තියෙනවා. ඉතින් මේ දේවල්වලදී අපි ඔක්කෝම එකතු වෙලා වැඩ කල යුතුයි කියලා අදහසකුත් කියනවා. ඒක බොහොම හොඳ යෝජනාවක්. හැබැයි අපි කවුරුත් ණයට තෙල් ගැහුවේ නැහැ. අපි කවුරුත් ණයට ගෑස් ගත්තේත් නැහැ. හැබැයි මේවාගේ තියෙන කළමනාකරණයේ දුර්වලතා නිසා තමයි අද අපේ රට මේ තත්වයට පත් වෙලා තියෙන්නේ. මොකද දැන් අපි කියනවානේ ලෝක ස්වාභාවයේ තත්වය හැබැයි මං හිතන්නේ මේ වන කොට ඉතියෝපියාව මේ තරම් අර්බුදයක් නිර්මාණය වෙලා නැහැ. අපි ඉස්සර උදාහරණයට ගත්තේ ඉතියෝපියාව රට. කෑමවලට ගහ මරා ගත්ත රටක් විදිහට තමයි ඉතියෝපියාව හංවඩු ගැහුවේ. හැබැයි අද වෙන කොට ඉතියෝපියාව ඉහළින් ඉන්නවා ලංකාව පහලින් ඉන්නවා. එතකොට අපි අපේ පාලනය අපේ ක්‍රමවේද මේ දක්වා අපි කොයි පැත්තටද දිසාගත කරලා තියෙන්නේ කියලා ප්‍රශ්නයක් තියෙනවා. ගොවිතැන තමයි ඉතිහාසයේ ඉඳන් මේ දක්වාම අපේ රට ගත්තානම් බෙස් එක වෙලා තියෙන්නේ කෘෂිකර්මාන්තය. එකේදී හොඳයි කාර්මික නිෂ්පාදන වලට යනවා නම් හොඳයි ඒක ඇත්ත. නමුත් එකේ ක්‍රමවේදයේ දුර්වලතාවයක් නිසා සෑහෙන්න අගාදයට පත් වෙලා තියෙනවා. ඒවගේම තමයි එකත් එක්කම සෞඛ්‍ය ආරක්ෂිත කෑම වේලක් කියපු එකට මං හිතනවා මේ වෙන කොට අවුරුදු 02කට පොහොර ගෙන්න පුළුවන් මුදල් ප්‍රමාණයක් මේ මාස වල හාල් ගෙන්නම වියදම් කරලා තියෙනවා. එතකොට අපි අතින් පැත්තෙන් කෑ ගහනවා අපේ රටට ඩොලර් නැහැ. හැබැයි තමන් ගාව වටපිටවේ තියෙන ඩොලර් පිටට දෙනවා. ඒවගේම තමයි සපුගස්කන්ද ගත්තාම බොරතෙල් ගෙන්නුවාම ලංකාවේ තෙල් නිෂ්පාදනයත් එක්ක ඒකේ අතුරු නිෂ්පාදනයන් වලින් තවත් සෑහෙන ප්‍රමාණයක් සම්පූර්ණ කර ගන්න තිබ්බ අවස්ථාවක්. නමුත් විවිධ තීන්දු තීරණ විවිධ අවස්ථාවල ගත්ත නිසා අද පිරිපහදු කරපු තෙල් ටික ගෙනවා. හැබැයි ඒවට වැඩි මිලකුත් ගෙවනවා. ඉතින් ඒකේ අතුරු නිෂ්පාදනයක් විදිහට අපිට ලැබිච්ච දේ එතැනින් අපිට අඩු වෙලා තියෙනවා. එතකොට අපි කියනවා තෙල් බෙහෙත් පොහොර ටික ගහන්න හොඳ නැහැ ගහන්න ඕන නැහැ. හැබැයි දැන් අපිට තියෙන ප්‍රශ්නේ තමයි දැන් අපි පිටරටින් ගේන ඔක්කෝම කාබනික සෞඛ්‍ය ආරක්ෂිත හොඳම ක්‍රමවේදයක් හදලාද. ඒ නිසා වැඩිය ගැඹුරට යන්නේ නැහැ. නමුත් කොතන හරි තියෙනවා මේකේ වැරුදීමකින් ගත්ත තීරණයක්. ඒක භුක්ති විදින්න තියෙන අවස්ථාව මං හිතන්නේ දශම 01ක් වත් භුක්ති විඳලා නැහැ. මේ රට මම හිතන්නේ ඒක භුක්ති විදින්න මේ එන වර්ෂය වෙන කොට මං හිතන්නේ ඒක දැනගන්න පුළුවන් වෙයි. මොකද ගොවිතැන කියන ඒක රටේ සියළු දෙනාම කන්න ඕනි ජීවත් වෙන්න පලමුව කන්න ඕනි. ඒ කියන්නේ එතකොට කරන්න පුළුවන් ශ්‍රමයක් දහඩියක් ඒ කියන්නේ හැකියාවක් එන්න ඉස්සරහට යන්න පුළුවන් ගමනක් තියෙන්නේ. ඒ කියන්නේ ශක්තිමත් ඇති ජාතියක් තියෙන්නේ හැමදාම හංවඩු ගැහිච්ච හැමදාම වහල්භාවයට පත් වෙන ජාතියක් තමයි නිර්මාණය වෙන්නේ. මොකද අපිට බෙහෙත් නැහැ කියන කොට ආ එහෙන් ණයට බෙහෙත් ටිකක් මේ බෙහෙත් ටික කාපල්ලා. අපිට කන්න නැහැ කියන කොට එහෙන් ආහාර ද්‍රව්‍ය ටිකක්

හම්බවෙනවා ආ මේ ටික කාපල්ලා. හැබැයි අපේ රටේ හැදෙන්නේ නැහැ හදන්නේ නැහැ. ඉතින් ඒක නිසා අපි ඉස්සර කිව්වානේ වැව් දසදහසක් තිබ්ච්ච රටක්නේ. මේක හැබැයි අද වෙනකොට දසදහස කොච්චර උනත් මං හිතන්නේ තියෙන ඒවා ටිකත් සංරක්ෂණය කර ගන්න බැරි අවස්ථාවක ඉන්නේ.

ප්‍රාදේශීය සභාවක් විදිහට අපේ ප්‍රදේශයේ තියෙන මං හිතන්නේ අපි ඔක්කෝටම කනින් කනට කියනවා තාම පාර හැදුනේ නැහැ කියලා. තම වැඩේ නිරවුල් නැහැ. ඉතින් අපිත් ඕක සැහෙන්න දුරක් කල්පනා කරා. මං හිතන්නේ මමත් ඒකේ යෝජනා කරා ඒ අදහසම මමත් ප්‍රකාශ කරන්න හිටියේ. චමින්ද මන්ත්‍රීතුමා රංගන මන්ත්‍රීතුමා කිව්වා ඒක ඇත්ත. ඒතැන අපි කන්ට්‍රැක් සමාගම මෙතැනට ගෙන්නුවා කියලා ඒකේ ප්‍රශ්නය නිරාකරණය වෙන්නේ නැහැ. එයා ඉන්නේ තවත් අවස්ථාවකින් අල්ල ගන්න බලාගෙන. ඒක නිසා ඒකේ වගකිවයුත්තා ඉන්නේ RDA නැත්නම් මාර්ග සංවර්ධන අධිකාරිය එතකොට අපි මේ ප්‍රශ්නය කතා කරනවා නම් කතා කරන්න ඕනි ඒ වගකිවයුත්තා හා වගවීමට භාජනය කරලා තියෙන ඒ අනිත් භාරකාරයා. අපි මේකේ අතරමැදි පුද්ගලයෝ අපිට එහෙට තීරණ ගන්නත් බැහැ මෙහෙට තීරණ ගන්නත් බැහැ. හැබැයි සභාවක් විදිහට අපේ යුතුකම කරලා තියෙනවා. අපේ මාර්ග ටික හදන්න කියලා අපි මේකේ නිශ්චිත අවසරය දීලා තියෙනවා. ඒ වගකිම ඉෂ්ඨ කරලා තියෙනවා. නමුත් එයාලට දුන්නු වගකිමෙන් ඒ වගකිම ඉෂ්ඨ කරන්නේ නැති අවස්ථා තමයි. ඒකේ ප්‍රධාන කොටස්කාරයෝ දෙන්නා තමයි අපි එක තැන තියාගෙන කතා කරන්න ඕනි මේ ප්‍රශ්නේ විසඳුමක් එනකම්. ඒ නිසා අපි මේ කාලවකවානුවක් ගත කලා. අපි යම් යම් ප්‍රමාණයකින් අපේ ප්‍රාදේශීය සභාවට අපේ ප්‍රදේශයේ ජනතාවට අපිට පුළුවන් හැකි ආකාරයේ අපි උදව් කරා වගේම සංවර්ධනය කරන්න පුළුවන් යම් යම් අවස්ථා අපි නිර්මාණය කලා. එහෙම නැහැ කියන්න බැහැ. ඒ ගිය එක්කෙනාම අපේ මේ ගැටළු නිරාකරණය කර ගන්න ඔබතුමා සහ මේ සභාව මැදිහත් වෙන්න. ඒවගේම අපේ මේ තියෙන ප්‍රශ්න වගකිව යුතු ආයතන හරහා ගණුදෙනුවක් හදාගෙන ඒවා නිරාකරණය කර ගන්න ඕනි. වටපිටාව ගොඩනගා ගන්න කියලා තමයි මට අවසාන වශයෙන් කියන්න තියෙන්නේ. ඒ නිසා සියළු දෙනාටම බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා</u>

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මට විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ දොස්තර මහත්තයා කිව්වා අපේ ඇම්බියුලන්ස් එක කැඩිලා දැන් මාසයක් විතර. එහේ ලෙඩෙක් ගේන්න මීගහකිවුලේ ඇම්බියුලන්ස් ඒක තමයි ගෙනියන්න වුනේ. මට ඊයේ දොස්තර මහත්තයා කිව්වා මන්ත්‍රීතුමා මේ ගෙනියන කොට ලෙඩ මැරුණොත් වගකීම මට බාර ගන්න බැහැ.

මුලාසනය සභාව අමතමින් ප්‍රධාන වෛද්‍යවරයෙක් ඉන්නවානේ. ගිලන් රථයක් භාර දෙන්නේ ඒ Hospital එකට. එක සභාවේ වගකිමක් නෙමෙයි. ඒක සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකිමක්. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කල යුතු කාරණාවක්. ඒ ගොල්ලෝ කරන්නේ නැතිනම් ඒගොල්ලෝ ලොකු ෙෆේල් එකක්නේ එතැන.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් එතුමාලා අදාල ස්ථානවලට ලිඛිතව යොමු කරලා තියෙනවා නමුත් තවමත් විසඳුමක් නැහැ.

මුලාසනය සභාව අමතමින් මන්ත්‍රීතුමා කවුරුහරි නිලධාරියාගේ දුර්වලකමක්. ඔය ගිලන්රථවලට මුදල් වෙන් කරලා හොස්පිටල් එකටම තියෙනවා අනුමැතියක් ඒගොල්ලන්ගේ ඉන්නවා කාර්මික නිලධාරි මහත්මයෙක් පලාත් පාලනයේ ඉන්නේ එයාලාගෙන් අනුමැතිය අරගෙන එතැන හදන්න බැරි නම් පළාත් සභාවේ හදන්නත් පුළුවන් බඩු ටික අරගෙන. ඒ කාරණාවට වෙනත් විකල්ප කාරණයක් . Doctor කියන්න ඒක කරගන්න පුළුවන්.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් ඒවගේම අද ආර්ථිකව වැටිලා ඉන්න අවස්ථාවකදී නමුත් අපි සියළු දෙනා දන්නවා දවසින් දවස බඩු මිල ඉහල යනවා. නමුත් ඉස්සර වතු කම්කරුවන් ගැන කතා කරා වතු කම්කරු වැටුප් ගැන.

පොහොර නැති නිසා දළු අස්වැන්න අඩුයි. මේ වතු වල කරන්නේ කිලෝ ගණනට තමයි ගෙවන්නේ. කිලෝ එකක් රු:40/=යි. ගිය මාසේ සමහර කට්ටියට රු: 600/= / රු:700/= දවසේ පඩිය තියෙන්නේ. අද පොල්තෙල් බෝතලයක් ගන්න නම් රු:810/= ඊයේ පොලේ දවසට පොල්තෙල් බෝතලයක්වත් ගන්න බැරි තත්වයක් තමයි පත් වෙලා තියෙන්නේ. ඒ නිසා අපේ ප්‍රදේශය ඔබතුමා දන්නවා ගොඩක් දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට මොනවා හරි සහනාධාරයක් ලබා දෙන්න කියලා අඩුමගානේ සමෘද්ධි ගැන කතා කරන කොට සමෘද්ධිලාභීන් ගොඩක් ගම්වල ගත්තාම කුඹුරු තියෙනවා තේ ඉඩම් තියෙනවා ඔක්කෝම තියෙන අයට හම්බ වෙනවා. නමුත් වතුකර ජනතාවට එහෙම දෙයක් නැහැ. මං හිතන්නේ ගොඩක් අසාධාරණ දෙයක්.

එතකොට අපි කියපු විදිහට පොහොර ප්‍රශ්නය ගැන කතා කරන කොට කොම්පොස් පොහොර දීලා හදන්න ඕනි විෂ නැති කෑම ගන්න ඕනි අදහස හොඳයි. නමුත් මේක ක්‍රියාත්මක කරන්න ඕනි ටික ටික. ඉන්දියාවෙන් හාල් ගෙනවා හාල් අඩුවට දෙන්නම් කියලා. ඒත් හාල් කිලෝ 01ක් රු:180/=යි. රෝබේරියේ. එහෙම තත්වයක් තමයි තියෙන්නේ. අපි මේ රෝබේරියට ග්‍රාමීය කමිටුව ගානේ අපි ලක්ෂ 30ක් වෙන් කරලා තිබ්බා. ග්‍රාමීය කමිටුවේදී අපි යෝජනා කරා වගාවන් සඳහා. එහෙම නමුත් මට දෙන්නේක් තුන්දෙනෙක් කිව්වා ඒගොල්ලන්ට වගාව කරන්න සඳහා නාමලේඛණය දෙන්න සමෘද්ධි මහත්තයා කියනවා මම දන්නේ නැහැ මං ගාව නාමලේඛණය ආවේ නැහැ කියලා.අපේ ගමේ කෙනෙකුට කුකුල් පැටවු 100ක් දීලා තියෙනවා. එක් කෙනෙකුට කුකුල් කාමරයක්වත් නැහැ.මොකුත් නැහැ ගේ ඇතුලේ දාගෙන හදන්නේ.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් කියන කොට ඒ කුකුල් පැට දුන්න ආයතනයේ නමත් එක්කම කියන්න.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් සමෘද්ධි ආයතනයෙන් තමයි දුන්නේ. එතකොට එයා කියනවා මන්ත්‍රීතුමා මොකක් හරි කරලා කුකුල් කෑම ටිකක් අරගෙන දෙන්න කියලා. කුකුල් කෑම ටිකක්වත් ගන්න විදිහක් නැහැලු.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් කුකුල් පැටවු 100 අරගෙන තියෙන්නේ කවුද?

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් අංක 14 ලයිමේ සුජිත් කුමාර.

මුලාසනය සභාව අමතමින් මම දකින්නේ සමෘද්ධිය වැරැද්දක් කරලා තියෙනවා. යටිතල පහසුකම් සංවර්ධනය කරගන්න බැරි මිනිහෙකුට කුකුල් පැටවු 100ක් දුන්නේ ඇයි. සමෘද්ධි නියාමක විරුද්ධව ලියුමක් ගහන්න ඕනි.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මම මේක කිව්වේ අපේ රටේ නිසි සැලසුමක් නැති තමයි මේ තත්වයට පත් වෙලා තියෙන්නේ.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් සුජිත් කුමාර කුකුල් පැටවු ගත්ත විදිහ මම දන්නවා. වෙන මනුස්සයෙකුට ආපු කුකුල් පැටවු ටිකක් ඒ මනුස්සයා හිටියේ නැති කොට බලහත්කාරයෙන් මට දෙන්න මම හදන්නම් කියලා අරගෙන ගියේ. මම ඒ වේලාවේ එතැන හිටියා. සමෘද්ධි සංවර්ධන නිලධාරි මහත්තයා ඇහුවා ඔයාට කොටුවක් තියෙනවාද කියලා. මම කොටුවක් හදා ගන්නවා මට පැටවු ටික දෙන්න කිව්වා. එයා පැටවු ටික return කරන්න ගියේ ඉල්ලපු එක්කෙනා ගන්න බැහැ කියලා කිව්වා. ඔය සුජිත් කුමාර කිව්වා මට දෙන්න මම හදා ගන්නම් ආය යවන්න එපා කියලා මම කොටුව හදා ගන්නම්.

මුලාසනය සභාව අමතමින් ඒ වැරැද්ද කරලා තියෙන්නේ සමෘද්ධි නිලධාරි ඔබතුමා ඔය වගේ ප්‍රශ්න ගේන්න එපා මෙතන කතා කරන්න.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් මේ රටේ නිසි සැලැස්මක් නැතිව කරන්න යන නිසා අපේ රට මේ තත්වය පත් වෙලා තියෙන්නේ කියලා.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ඔය කට්ටිය අවුරුදු 05ක් හිටියානේ ඔයගොල්ලන් මේ රටට ජාතික ප්‍රතිපත්තියක් හැදුවද මේ රටට සැලැස්ම හැදුවද.

**සභාව උණුසුම්...............**

මුලාසනය සභාව අමතමින් ඔබතුමාට ලබා දුන් අවස්ථාව ඉවරයි ඔබතුමා වාඩිවෙන්න.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් විනාඩියක් ඉන්න රෝබේරිය සුසාන භූමිය මැනීම් කටයුතු සඳහා මම ඇමතිතුමා හරහා ලක්ෂ 2 ½ ක් වෙන් කරලා තියෙනවා. ඒ සුසාන භූමිය 2006 වසරේ මම හිතන්නේ සොහොනේ ගෙයක් හදලා තියෙනවා සභාවෙන් සුබ්‍රමනියම් මාස්ටර් හිටපු කාලේ. එතකොට ඒ ඉඩම ඇවිල්ලා සභාවට අයිති වෙලාද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියනවා කියලා දන්නේ නැහැ.

මුලාසනය සභාව අමතමින් ඔබතුමා මේ යෝජනාව දාලාද තියෙන්නේ. ලක්ෂ 2 ½ කොහෙටද ඇවිල්ලා තියෙන්නේ. ඒ මුදල කොහෙටද ඇවිල්ලා තියෙන්නේ.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තමයි ඇවිල්ලා තියෙන්නේ.

මුලාසනය සභාව අමතමින් ඔබතුමා මට ඒකේ copy ගෙනල්ලා දෙන්න. සොහොන් භූමිය අපිට අයිතියි. අපි ඒක කරලා දෙන්නම්.

**මීළගට මූලාසන සභාව අමතා මූලාසනයට පිළිතුරු කතාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

මූලාසන සභාව අමතමින් අද දවස ඉතාම වැදගත් දවසක්. ඉතින් මං හිතන්නේ අපි මුලින්ම ඔබතුමාලා සුභ පැතුවා අපේ ලේකම්තුමියට ඉතින් මං හිතන්නේ මට පොඩි වෙනසකුත් තියෙනවා අද බොහොම හොඳට මේ කටයුතු ටික රාජකාරිවල ලිපිවල තියෙන කටයුතු ටික එතුමිය දැක්කා ඇවිල්ලා දවස් 02න් 03කින් එතුමිය බොහොම සංවරව ඒ ටික හරියට නිවැරදිව කරනවා. ඒක නිසා අපිට තියෙනවා අඩුපාඩු ගොඩක් අඩුවෙයි ඉස්සරහට. එතුමියටත් සුභ පතනවා. අපි මෙතන meeting එකක් තියලා සුභ පැතුවා. ඒකත් මතක් කරමින්,

අද දවසේ අපි ඔක්කෝම කතා කරේ මං හිතන්නේ රටේ තියෙන දරිද්‍රතාවය. ලෝකයේ තියෙන ප්‍රශ්න. වත්තේ තියෙන ප්‍රශ්න. ඇත්තටම ගැටළු කතා කරේ. මම හිතන්නේ මම ගමේ තියෙන ගැටළු තමයි මම කතා කරන්නේ. මුලින්ම ආරම්භයක් ගන්නවා අපි නිදහස ලැබුවාට පස්සේ අපි නිදහස් ජාතියක් වුනාට පස්සේ අපි එදා ඉඳන්ම තමයි මේ පිටරැටියන්ට ණයකාරයෝ වෙන්න පටන් ගත්තේ. ඒ නිසා ශ්‍රී ලංකා එකට ඇඟිල්ල දික් කරන්නත් බැහැ. UNP එකට ඇඟිල්ල දික් කරන්නත් බැහැ පොහොට්ටුවට ඇඟිල්ල දික් කරන්නත් බැහැ. තවත් JVP එකට ඇඟිල්ල දික් කරන්නත් බැහැ. මම නම් දකින්නේ මේ තියෙන පක්ෂ වලට ඇඟිල්ල දික් කරන්න බැහැ.එදා ඉඳන්ම මේ දේශපාලඥයෝ කරේ පගාව දීලා ඡන්දේ ගන්න එක අපි වුනත් එහෙම තමයි කරන්නේ. ඒ කියන්නේ රස්සාවක් දෙන්නම් කියලා ඡන්දේ ගත්තා. මුලින්ම Telephone දෙන්නම් කියලා ඡන්දේ ගත්තා. ඇල හදනවා කියලා ඡන්දේ ගත්තා. පාර හදනවා කියලා ඡන්දේ ගත්තා. අදත් අපි එහෙම තමයි කරන්නේ. මේ සියළු දෙනාම මේ දේ කරනවා රට හදනවා කියලා එහෙම චින්තනයක් තුල තමයි අපේ රට මෙච්චර කාලයක් මේ රට අගාදයට ඇද වැටිලා ඉන්නවා කියලා කියනවානේ අපි. මේක හංගන්න ඕනි නැහැ අපි ඔක්කෝම වැටිලා ඉන්නවා. හැබැයි මේක ගෝඨාභය රාජපක්ෂවත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණවත් තනියෙන් කරපු දෙයක් නෙමෙයි. මේ සියළු දේ අපි ඔක්කෝම ඉන්න නිසා කාටවත් ඇඟිල්ල දික් කරන්න බැහැ මේක මෙහෙම වුනයි කියලා.

මොකද අපි එදා ඉදන්ම පිටරටින් ණය ගත්තා පිටරටට අපි ගැති වුනා. අපි හැමදාම ලොකු කුළුණු හැදුවා අපි පොහොර ගහන කොට උඩිනුත් ගැහුවා යටිනුත් ගැහුවා බිමිනුත් ගැහුවා අපි පොහොර නිකම් දුන්නා. අපේ රජතුමා පොහොර නිකම් දුන්නා. මිනිස්සු ගනන් ගත්තේ නැහැ. හැබැයි කුඹුරු විනාශ වුනා. අවේ ප්‍රතිඵලේ එකයි. මං දන්නවා අපි කතා කරලා කෑ ගැහුවාට පහුගිය දවස්වල මිනිස්සු ළඟ පොහොර තිබුනා. ඒ පොහොර තිබුණු නිසා යම් ප්‍රමාණයක් පොහොර කිලෝ 50ක් දාන තැනට පොහොර කිලෝ 10ක් දාලා ඒ අස්වැන්නම ගත්තා. එහෙම නැහැ කියලා කියන්න බැහැ. එහෙම හංගන්න බැහැ. වැඩක් කරන්න බැරි එකාට පොහොරවලින් නැව්වත් ඒක හරියන්නේ නැහැ. ඉතින් මං හිතන්නේ එහෙම ක්‍රමවේදයක් අපි ළඟ සැලසුමක් නැහැ. අපි දන්නවා එදා අපි පුට්බයිසිකල් පැද්දා. අපි පුංචි කාලේ පුට්බයිසිකල් පැද්දා කට්ටිය හුඟදෙනෙක්. හැබැයි අද පුට්බයිසිකලයක් නැහැ. අද නුවර ඉඳන් බදුල්ල එනකම් කොළඹ  වෙනකම් පුට්බයිසිකල් 10ක් හොයාගන්න පුළුවන්ද. ලංකාවේ තියෙනවාද කියලා බලන්න නැහැ. හැබැයි ඊයේ මං නුවර ඉඳන් මීගහකිවුලට එනකම් මම දැක්කා ටවුන් එකේ 25කට වැඩිය විදේශිකයෝ පුට්බයිසිකල් පදිනවා. මේක ඇත්තටම ඇයි මේවා ෆෙස්බුක් මාධ්‍යයේ දාන්නේ නැත්තේ. ඇයි මේ මාධ්‍යකාරයෝ මේවා දකින්නේ නැත්තේ. මම දැක්කා රන්දෙණිගල පාර වයසක මිනිස්සු පුට්බයිසිකලේ පැදගෙන යනවා. හැබැයි අපේ ලංකාවේ පුංචි කොල්ලා තරුණ කොල්ලා යන්නේ මොකේද බයික් එකේ නැත්තම් කාර් ඒකේ නැත්තම් ඩිෆෙන්ඩර් එකේ නැත්තම් හැමර් එකේ. මෙන්න අපේ මානසික මට්ටම. මේ මානසික මට්ටම නිසා තමයි අපිට ඩොලර් නැතිවුනේ. විදේශිකයෝ ටික අද යනවා බයික් එකේ. අපේ රටේ මිනිස්සුන්ට යන්න බැහැ බයිසිකලේ. පුට්බයිසිකල් කුලියට දෙන්නේ ශ්‍රී ලංකාවේ විදේශිකයන්ට. එතනොට ඔයගොල්ලෝ පොඩ්ඩක් යන්නකෝ මඩකලපු පැත්තේ ගිහිල්ලා ඇතිනේ. මඩකලපුව පැත්තේ තවමත් බයිසිකල් රංචු පිටින් යනවා. හැබැයි බයිසිකලයක් පැද්දම තියෙන වාසිය මොකක්ද තමන්ගේ Physical fitness හැදෙනවා. තමන්ගේ මානසික මට්ටම හැදෙනවා. තමන්ගේ පසුම්බිය ඉතිරි වෙනවා. මේ සියළු දේ අත හැරලා. මෙවැනි මානසික මට්ටම හැදුනේ එදා ඒ දේශපාලන නායකත්වය තුල තිබුණු වැරදි අවබෝධ නිසා තමයි අපි මේ තත්වයට වැටුනේ. අපි English film එකක බැලුවොත් ඔබ අනිවාර්යයෙන්ම දකිනවා ඇති පුට්බයිසිකල් පදිනවා දකිනවා. එංගලන්තේ එකක් බැලුවත් ඇමරිකාවේ එකක් බැලුවත් කොහේ බැලුවත් පුට්බයිසිකලයක් පදිනවා. අපේ අලුත් film වල ඒවා දකින්න නැහැ. ඒවාගේ දකින්නේ ඩිෆෙන්ඩර් හැමර් අන්න අපේ මානසික මට්ටම අන්න අපි එතැනට වැටිලා තියෙන්නේ. ඒක නිසා මන්ත්‍රීතුමා අපි අරයාගේ මූණට මෙයාගේ මූණට බැණ ගත්තට වැඩක් නැහැ. අපේ දේශීය නිෂ්පාදනය හොඳටම බිම වැටිලා. දියර කිරි තියෙනවාද නැහැ. අපි කිරි හරක් හදනවාද නැහැ. එදා අපේ ගමේ අපි දන්නවා ගමට අවශ්‍ය තරම් කිරි ගෙනල්ලා මේ මීගහකිවුලට මකුළුගොල්ලෙන් ඇති තරම් කිරි බෙදුවා. අපිට හොඳ කිරි ටිකක් ගෙනල්ලා දුන්නා. මිනිස්සු හැන්දෑවට ඇවිල්ලා බෝතල් එකතු කරගෙන සල්ලිත් එකතු කර ගෙන යනවා. එදා අපි ඒක කරා, අද අපිට ඒක නැහැ. අද කිරි පිටි පැකට් එක හොයා ගෙන යන්න. අද කිරිපිටි පැකට් එක රු:1900/=ක් වෙනවා. ඒක තමයි අපිට වෙලා තියෙන්නේ. අපි ඉතින් කර ගත්ත දේවල්වල පාපකර්ම තමයි අපි මේ ගෙවන්නේ. ඒක නිසා මම නම් මේ කිසිම රජයකට ඇඟිල්ල දික් කරන්නේ නැහැ. අපේ කොතන හරි වැරදිච්ච තැන් කිහිපයක් තියෙනවා. ඒ වැරදි විවෘත ආර්ථිකය ප්‍රතිපත්තිය මේවාගේ දේවල් තුල අපේ දේවල් අපි හැදුවේ නැහැ. අපි හැමවේලාවේම දේශපාලඥයෝ හැදුවේ, මිනිස්සු නෙමෙයි හැදුවේ. අදටත් අවස්ථාව දෙන්නම් අරක දෙන්නම් මේක දෙන්නම් කියලා හැම ආණ්ඩුවකින්ම ඒක තමයි කරේ. එහෙම හදලා තමයි අපි මේ තත්වයට මේක ගෙනාවේ. අද මෙන්න වැටිලා. ඔන්න ඕක තමයි අපිට වෙලා තියෙන්නේ. හාල් පොල් තවත් පෝලිම් එන්නත් පුළුවන්. මම ලොකුවට කතා කරන්නේ නැහැ. මම ආර්ථික විශේෂඥයෙක් නෙමෙයි. ඒවගේම මම උද්ධමනය කියන වචනේ ගැන ලොකුවට දන්නේ නැහැ. මම දන්නේ මේ ගමේ කමට දන්න ටික මම ඔයගොල්ලන්ට කියන්නේ. ඒ නිසා මම කියන්නේ අපි ගම හදා ගමු කියලා.

අපිට පුළුවන් දැන් අපිට වතුර ලයින් එක ඇවිල්ලා තියෙනවා. මේකේ පක්ෂ පාට නැහැ. ඔක්කෝටම වතුර එනවා. ඒ එන වතුර අපේ අහිංසක මිනිස්සුන්ට දෙන්න පුළුවන්. අපි සතුටු වෙන්න පුළුවන් කාරණ කිහිපයක් තියෙනවා.අපි පුංචි ලෝකාන්තය හැදුවා. කාටවත් කියන්න බැහැ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අපේ කොල්ලෝ ටිකත් එක්ක අපේ මන්ත්‍රීතුමන්ලත් එක්ක මට පුළුවන් වුනා අද ලොකු ආදායමක් ගෙන්න. රු:50/= ටිකට් එකෙන්. ලොකු ආදායමක් අපි මෙතැනට ගෙනල්ලා දෙනවා. මම

දන්නවා පහුගිය දවස් 02 තුනේ ලක්ෂයට වැඩි ආදායම තිබුණා. නමුත් අපි දැන් ආදායම් ලබනවා. දැන් අපි මැනේජ්මන්ට් කර ගන්න පුළුවන් මම එකේ අයිතියත් පවරා ගෙන තියෙනවා. අද හෙට ගියත් මාව පැරදිලා ගියත් කවදාහරි දවසක මේකට එන මිනිහට කියන්න වචනය කියන්න අපි ආදායම් මාර්ගයක් හදලා තියෙනවා. අපි ගමට වතුර දීලා තියෙනවා අපි ගමට ලයිට් දීලා තියෙනවා. අපි ගමේ පාරවල් විශාල ව්‍යාපෘතියක් මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව.තමයි ඌව පළාතේ වැඩිම මාර්ග හදලා තියෙන්නේ. ඒක නැහැ කියලා කියන්න බැහැ කාටවත්. ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර් 46ක් හැදුවා. ඒවගේම ලක්ෂ 20 ගානේ ගමට දෙන එකෙන් අපි හැදුවා. ඊට පස්සේ උඩ පාරවල් හදනවා. මේ සියළු මාර්ග අපි හැදුවා. හැබැයි පොඩි පොඩි අඩුපාඩු නම් තියෙනවා. හැබැයි මම අදත් කියනවා අපි මින් පස්සේ සභාවක් වශයෙන් එකතු වෙලා ඊළඟ තමයි මේ එන කොන්ත්‍රාත්කාරයෝ අපිට ආදරේට එන්නේ නැහැ. මේ කොන්ත්‍රාත්කාරයෝ පැකේජ් එකක් අරගෙන එනවා ඇවිල්ලා ගන්නවා ලොකු ඔෆිස් එකක් ගමේ කිහිප දෙනෙක් අල්ලගන්නවා. සභාපතිතුමාටත් කතා කරනවා කතා කරලා මුල් ගල තියන්න ලෑස්ති වෙන්න කියලා කියනවා. මන්ත්‍රීවරුන්ටත් එක්ක අපි ඒ මුල්ගල තියන්නේ නැහැ. අපිත් ආසයි ගමේ මිනිහෙකුට වැඩ කරන්න. මේ මන්ත්‍රීවරු ඔක්කෝම කැමතියි. ඒවා කරද්දී අපි ගිහිල්ලා ඒ පාරේ මුල්ගල තියනවා. ඒකල්ලා මොනද බෝඩ් එකක් දානවා මාගේ ෆෝටෝ එක මන්ත්‍රීතුමාලාගේ ෆෝටෝ එක තියෙනවා ජනාධිපතිතුමාගේ තියෙනවා. ඔක්කෝම පින්තූර තියෙනවා. ඒ බෝඩ් එකේ තියෙනවා මෙච්චරයි මිලියන ගණනක් ව්‍යාපෘතියක් මේක කියලා ලොකුවට තියෙනවා. කර ගෙන යන කොට ආව ගමන් මැෂින් දලා දඩබඩ ගාලා පාර කපනවා. මේවා බොරුද ඇත්තද කියලා ඔයාලා හොයලා බලන්න. කපලා දානවා ඊට පස්සේ මැටල් ටිකකුත් ගෙනවා ඔක්කෝම ගෙනවා වැඩේ පටන් ගන්නවා. ගමේ මිනිස්සුත් ගන්නවා ඒ අතරතුර වැඩ කරන්න මාසයක් විතර වැඩ කරන්න. අරගෙන මුන් කරන්නේ මොකක්ද මේ එන කම්පැනියක්වත් වැඩ කරන්නේ නැහැ. මේ පාරවල්වල කරන්නේම හොරු ටිකක් ගෙනල්ලා උපකොන්ත්‍රාත්කාරයෝ ගෙනල්ලා මීගහකිවුල හැම පාරක්ම දිලා තියෙන්නේ උප කොන්ත්‍රාත්කාරයෝන්ට. උප කොන්ත්‍රාත්කාරයෝ කරන්නේ උන්ට සල්ලි ටිකක් හම්බ කරගත්තා උන් කරන්නේ නැහැ උන් පැනගත්තා. ඒක තමයි වැව තැන්න පාරට වෙලා තියෙන්නේ. ඒක තමයි පිටමාරුව පාරට වෙලා තියෙන්නේ. ඒක තමයි පොල්ගහඅරාව පාරට වෙලා තියෙන්නේ. ඒවගේ ලොකු ව්‍යාපෘති ගණනාවක් ඒගොල්ලන්ගේ වැඩේ කරගෙන ඒගොල්ලන් යනවා. ඒගොල්ලන් සුඛෝපභෝගී වාහන ගන්නවා මිලියන 250 එකපාරටම 20% ගන්නවා. කොච්චරද මුදල කියලා බලන්නකෝ. ඒ මිනිස්සුන්ට මීගහකිවුලේ මිනිස්සු වැඩක් නැහැ. අපිට ආව යෝජනා වැඩක් නැහැ. අපි මේ යෝජනා හදන්න සභාවේ සල්ලි වියදම් කරලා තියෙනවා කෑමටික දෙන්න බීම ටික දෙන්න ඔයගොල්ලන් මට අනුමැතිය දීලා තියෙනවා. අර ඉංජිනියර් කියනවා මේ ඉංජිනියර් කියනවා කොළඹින් එනවා උත්සව සරසනවා. මගේ තනි මහන්සියෙන් මගේ තනි උත්සහය දරලා තියෙනවා. මේ සියළු දේවල් වල ප්‍රතිඵල ලබන්නේ කවුද කොහෙන්වත් එන කොම්පැණිකාරයෝ. අන්තිමට ගමට පාර නැහැ. අවුරුදු 05ක් වෙනවා I Road එක. තාම මේවා හදලා ඉවර නැහැ. මම කියන්නේ රජයේ වැරැද්ද නෙමෙයි. මේ අධීක්ෂණ නිලධාරින්ගේ වැරැද්ද. ඇයි මේ නිලධාරියෝ ටිකට විරුද්ධට කතා කරන්න බැරි. අපිට මේ වැරදි ගොඩක් කරනවා මේ මිනිස්සු, ඒ නිසා මං හිතන්නේ ඔබතුමාලාට වැඩිපුර කතා කරන්න ගියොත් දේශපාලනය වෙනත් පැත්තකට යනවා. ඒ නිසා මං කියන්නේ මේ කාරණා අපිට අද මේ රටේ තියෙන වාතාවරණයත් එක්ක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විතරක් ඇඟිල්ල දික් කරන්න බැහැ. අපි දන්නවා පහුගිය යහපාලන ආණ්ඩු සමයේ හිටපු කණ්ඩායම තමයි මේ ආණ්ඩුවට ඇවිල්ලා 69 ලක්ෂයක් පෙන්නලා 2/3 බලයක් දීලා විශේෂ බලයකුත් දීලා ඒකට ආවොත් ඒ යහපාලන ආණ්ඩුවේ හිටපු ටීම් එකම තමා. ඔබතුමාලාගේ හිටපු ටීම් එකම තමයි වතුකරයේ ජනතාවත් ආවා ඇවිල්ලා තමයි දුන්නේ හැබැයි දැන් අවුල් වෙනකොට ඒගොල්ලන් යනවා එහා පැත්තට මේ කණ්ඩායම නෙවෙයිද  වැරදි. මේ දේශපාලනය නෙමෙයි වැරදි මේ කණ්ඩායම හරියට තීන්දු තීරණ ගන්න කණ්ඩායමක් තෝරා ගන්න ඕනී. ඒ නිසා එහෙට මෙහෙට පනින්න ඕනවෙන්නේ. අපිට ගමක් වශයෙන් කරන්න පුලුවන් කාරනාව කරමු. මං හිතන්නේ අනාගතයේදී සුහදායී සුභ ප්‍රතිඵල ලැබෙන ලකුණු තියෙනවා ඒ ලකුණු තිබුනත් අපි එදා අර කිවුවා වගේ අපේම ගැමි ආර්ථිකයක් අපිම නිෂ්පාදන ආර්ථිකයක් අපේම දේවල් අපි පොහොර ටිකක් හදාගමු. හැබැයි ඉතින් මෙහෙමයි හදා ගත්ත පොහොර ටික ඕනි. කාබනික පොහොර නෙමෙයි රසායනික පොහොර අවශ්‍ය වෙනවා. මුල් ටික හදාගෙන යම් පිලිවලකට අපිටත් පුලුවන් එංගන්තය වගේ ඕස්ටේලියාව වාගේ පින්ලන්තය වාගේ ලෝකේ සතුටින් ඉන්න රට පින්ලන්තය. අපිටත් පුලුවන්

පින්ලන්තය වාගේ හොදට ජීවත් වෙන්න පුලුවන් රටක් අපිට නිර්මාණය කරගන්න අපිට ලැබෙයි. මං හිතන්නේ ඒක කරන්න පුලුවන් ගමෙන්. අපි සභාපතිවරු මන්ත්‍රීවරු  වශයෙන් කොච්චර සතුටින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවේන් අයින් වෙලා තවම උබ නොදකින් කියලා මෙතනින් එලියට ගිහිල්ලා කියනවාද. මේ අවුරුදු 4ට කිසිම කෙනෙක් කියලා නැහැ . අපි ඔක්කොම සතුටින් හිටියා. කොච්චර මොනා කරගත්තත් එලියට ගිහිල්ලා පස්සේ  කතාකරනවා. ඒක තමයි මාගේ නම් සතුට. ඒ සතුට අපි හිත කියන්න පුලුවන් අපේ මතිමතාන්තර මෙතන කතා කරලා. අපට ඒ කාරනාව ඉස්සරහට හුගක් හොදට කරගෙන යන්න. අපිට අවශ්‍ය යටිතල පහසුකම් ටික හම්බ වුනා. කවුරු දුන්නාද කියලා නෙමේ වැදගත් වෙන්නේ ජාතික ප්‍රතිපත්තිය නැති වුනත් අපි ග්‍රාමීය ප්‍රතිපත්තියක් හරි හදාගෙන අපි අපේ ගමන යමු, ඒ කියන ගෞරවනීය ඉල්ලීම කරමින් අද දවසේ මේ සභාවට සහභාගී වුනු උප සභාපතිතුමා විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරන අතර ඒ වාගේම අද දවස ඉතාමත් සාර්ථකව කරගෙන යන්න ශක්තියක් වුණු  නව ලේකම්තුමියට ඒ වාගේම ඒ නිලධාරිතුමියට මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමින් ඔබ සියළු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

සභාපති
ප්‍රාදේශීය සභාව,මීගහකිවුල

2022 ....................................................... වන දින මීගහකිවුල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදි ගරු ප්‍රාදේශීය සභා උප සභාපති/ගරු මන්ත්‍රී ............................................................. මැතිතුමා විසින් යෝජනා කිරිමෙන් හා ගරු ප්‍රාදේශීය සභා උප සභාපති/ගරු මන්ත්‍රී.....................................................................මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් 2022 .......................................................... දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීම් වාර්තාව  සත්‍ය වාර්තාවක් බව ඒකමතිකව පිළිගන්නා ලදි.

එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
සභාපති,
ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.